(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 2(2).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2019 මැයි 10 සිකුරාදා**

## 2019 මැයි 21 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මෝටර් වාහන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

## 2019 ජූනි 04 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

23/’18

ගරු හේෂා විතානගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ, වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්බැවිල හන්දියේ සිට රංවල හරහා උඩවෙල මාර්ගය වසර ගණනාවක සිට අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් දැඩි ලෙස අබලන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය අයත්වන ආයතනය කවරේද;

(ii) මෙම මාර්ගය ගමනාගමනයට සුදුසු වන ලෙස අළුත්වැඩියා කිරීමට සැලසුම්කර තිබේද;

(iii) එසේ නම්, අළුත්වැඩියා කිරීම ආරම්භ කරනු ලබන දිනය සහ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iv) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(v) මේ වනවිට එම මුදල් වෙන්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

76/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2018 මැයි මාසයේදී ඇති වූ හදිසි ජල ගැලීම්වලින් පීඩාවට පත් ජන සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) හානි වූ ජීවිත සංඛ්‍යාව කොපමණද;

(iii) හානි වූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ආපදා සහන කටයුතු සඳහා රජය වෙන්කළ මුදල කොපමණද;

(v) වන්දි වශයෙන් ගෙවන ලද මුදල කොපමණද;

(vi) වන්දි ලබාදුන් පවුල් සංඛ්‍යාව කොපමණද;

(vii) මේ වනවිට වන්දි ලබා දී නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(viii) වන්දි ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

134/'18

ගරු වමින්ද විජේසිරි මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේ සිට අද දක්වා ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ සිටි සාමාජිකයන්ගේ නම් හා ඔවුන්ගේ සේවා කාලසීමා කවරේද;

(ii) එම එක් එක් කාලසීමාව තුළ ප්‍රදර්ශනයට අනුමත කළ සිංහල චිත්‍රපටවල නම් කවරේද;

(iii) එම එක් එක් කාලසීමාව තුළ වාරණයට ලක්වූ සිංහල චිත්‍රපට හා ඒවායේ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iv) එම චිත්‍රපට වාරණය කිරීමට ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය ගත් තීරණවලට හේතු කවරේද;

(v) යහපාලන රජය යටතේ වාරණයෙන් තොරව ගුණාත්මක සිංහල චිත්‍රපට කලාවක් බිහිකිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

219/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ග්ලයිෆොසේට් තහනම් කිරීමට රජය තීරණය කළ දිනය කවරේද;

(ii) ඒ සඳහා බල පෑ හේතු කවරේද;

(iii) එම තහනම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ විද්වත් සංවිධාන හෝ පුද්ගලයන් කවුරුන්ද;

(iv) ග්ලයිෆොසේට් තහනම ඉවත් කිරීමට රජය තීරණය කළ දිනය කවරේද;

(v) ඒ සඳහා බල පෑ හේතු කවරේද;

(vi) තහනම ඉවත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ විද්වත් සංවිධාන හෝ පුද්ගලයන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

240/’18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහවැලි ගඟේ වැලි ගොඩ දැමීම සඳහා විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බලපත්‍ර ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) මෙම බලපත්‍ර ලබා දීම හේතු කොට ගෙන විල්ගමුව ප්‍රදේශයේදී මහවැලි ගඟට විශාල පාරිසරික හානියක් සිදුවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම හානිය වැළැක්වීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

255/’18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

335/’18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග බොහොමයක් අබලන් වීම හේතුවෙන් මහජනතාව දැඩි අපහසුතාවයට පත්වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, මෙම මාර්ග කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

381/'18

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ වනවිට වසර 106ක් සපුරන ශ්‍රී ලංකා බාලදක්ෂ ව්‍යාපාරයට 75000 කට අධික බාලදක්ෂ දරු දැරියන් අයත් වන බවත්;

(ii) බාලදක්ෂයන් "වැඩ සතියේ" දී වාර්ෂිකව උපයා බාලදක්ෂ මූලස්ථානයට ලබා දෙන රුපියල් මිලියන 8ක මුදල පසුගිය පස් වසරක කාලයේදී නිසි ක්‍රමවේදයකින් තොරව වියදම් කර ඇති බවත්;

(iii) මූලස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීමේදී බාලදක්ෂ කමිටු සාමාජිකත්වයේ අවසරයකින් තොරව, හිටපු ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස් නිමල් ද සිල්වා මහතාගේ හිතවත් සමාගමකට උපදේශක ගාස්තු ලෙස රුපියල් මිලියන 8ක්ද, නිසි පරිදි ඉදිකිරීම් නොකළ ගොඩනැගිල්ල වෙනුවෙන් රුපියල් මිලියන 14ක්ද ගෙවා ඇති බවත්;

(iv) බාලදක්ෂ "වැඩ සතියේ" උපයන ලද මුදල් භාවිතා කරමින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිසි අවසරකින් තොරව නුවරඑළිය ප්‍රදේශයේ බාලදක්ෂ කඳවුරක් සඳහා ඉදිකරන ලද සිමෙන්ති කුටි තහනම් කිරීම හේතුවෙන් විශාල මූල්‍ය පාඩුවක් සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මෙම මුදල් අවභාවිතාව සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් ආරම්භ කර තිබේද;

(ii) එහි ප්‍රගතිය කවරේද;

(iii) නොඑසේ නම්, ඉදිරි කාලයේදී මෙම කාරණය සම්බන්ධයෙන් පූර්ණ විමර්ශනයක් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

490/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරවුම්හල්වල ලිපිනයන් කවරේද;

(iii) එම පිරවුම්හල් අතරින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු පිරවුම්හල් හා IOC සමාගම සතු පිරවුම්හල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2010 වර්ෂයේ සිට මේ දක්වා මහනුවර දිස්ත්‍රික්කය තුළ ලබා දී ඇති ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(v) එම බලපත් ලබාගත් පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(vi) එසේ බලපත්‍ර ලබාදීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව උපයාගත් මුදල කොපමණද;

(vii) එසේ ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර ලබාදීමේ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සැලකිල්ලට ගනු ලැබූ නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

536/'19

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මහජන සම්පත 'රජ දිනුම' නමින් ලොතරැයි දිනුම් ඇදීමක් සිදුකරන බවත්;

(ii) එම ලොතරැයියේ 3328 වැනි දිනුම් ඇදීමෙන් අලුත්ම හයිබ්‍රිඩ් මෝටර් රථයක් ලබා දෙන බවට ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ප්‍රචාරක දැන්වීමක් පළ කළ බවත්;

(iii) එම දිනුම් ඇදීමේදී උඩුදුම්බර, මඩුගල්ල, කලමුන පදිංචි කේ. ඩබ්ලිව්. ජී. බී. කපුකොටුව මහතා මෝටර් රථය ජයග්‍රහණය කළ බවත්;

(iv) එම මෝටර් රථය 2017.01.25 දින ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පරිශ්‍රයේදී කපුකොටුව මහතාට භාරදුන් බවත්;

(v) වාහනයේ ලියාපදිංචි සහතිකය පරීක්ෂා කිරීමේදී ඒ මහතාට ලබාදී ඇත්තේ අලුත් (Brand New) මෝටර් රථයක් නොව පාවිච්චි කර අලුත්වැඩියා කරන ලද (Reconditioned) මෝටර් රථයක් බවත්;

(vi) මේ ගැන ජාතික ලොතරැයි මණ්ඩලයට පැමිණිලි කළද, කිසිදු පිළිතුරක් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා මෙම වංචාව සිදුකළ අයට එරෙහිව නීත්‍යානුකූල පියවර ගන්නේද;

(ii) කපුකොටුව මහතාට නව මෝටර් රථයක් ලබාදීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

565/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 'ගොවිසෙත' ලොතරැයිය ආරම්භ කළ දිනය කවරේද;

(ii) එහි ආරම්භක අරමුණු කවරේද;

(iii) එම ලොතරැයිය ආරම්භයේ සිට මේදක්වා එය අලෙවි කිරීම මඟින් ඉපයූ ආදායම වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ආදායමෙන් ත්‍යාග වශයෙන් ලබාදුන් මුදල වාර්ෂිකව කොපමණද;

(v) ගොවි ජනතාවගේ සුබසාධනය සඳහා වැයකළ මුදල කොපමණද;

(vi) ඉදිරියේදී වැඩි මුදලක් ගොවි ජනතාවගේ සුබසාධනය සඳහා වැය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

591/’19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 290 ට අනුව, ලැයිස්තුගත දේපළ වෙළඳාම් භාරයක් (Real Estate Trusts) පිහිටුවනු ලැබුවේද;

(ii) එවැනි භාරයක් පිහිටුවීමට අදාළ ප්‍රාරම්භක කාර්යයන් පිළිබඳ වගකීම පවරා දුන් පාර්ශ්ව කවරේද;

(iii) ලැයිස්තුගත ඒකක භාරයක් පිහිටුවීමකින් තොරව, රජයේ ඉඩම් මහා පරිමාණ නිවාස ව්‍යාපෘති සඳහා පෞද්ගලික ව්‍යාපාරිකයන්ට පවරා දී තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වන කොන්දේසි හා ගෙවීම් කවරේද;

(v) රජයේ ඉඩම්, මහා පරිමාණ නිවාස සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් පෞද්ගලික ව්‍යාපාරිකයන්ට පවරාදීමේදී ඒ සඳහා නිසි පරිදි අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී තිබේද;

(vi) එසේ නම්, පෞද්ගලික ව්‍යවසායකයන් තෝරාගැනීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

679/’18

ගරු කනක හේරත් මහතා,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පැරණි වතු නිවාස (ලැයින් කාමර) වෙනුවට නව නිවාස ලබාදීමේ වැඩපිළිවෙළ යටතේ නිවාස ලබා දී ඇති වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙතෙක් නිවාස ලබා දී නොමැති වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිවාස ලබාදීමේ වැඩසටහනට අනුව කෑගල්ල දිස්ත්‍රික්කයේ නිවාස ලබා දිය යුතු වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙතෙක් නිවාස ලබා දී ඇති වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) නිවාස ලබා නොදුන් වතු පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එක් වතු නිවසක (ලැයින් කාමරයක) මේ වනවිට පවුල් කිහිපයක් එකට පදිංචි වී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, නව නිවාස ලබාදීමේ වැඩපිළිවෙළ කඩිනම් කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

693/’19

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2017.07.31 දිනට රැකියා දස ලක්ෂයේ රජයේ ව්‍යාපෘතිය යටතේ ලබා දී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

759/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් වකුගඩු රෝගීන් සිටින පවුල්වල නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ආධාර මුදලක් ලබා දෙන බව දන්නේද;

(ii) එම ප්‍රතිලාභය ඉල්ලුම් කිරීමට අවශ්‍ය කරන සුදුසුකම් සහ ඉදිරිපත් කළ යුතු ලේඛන කවරේද;

(iii) ඒ යටතේ නිවසක් අලුත්වැඩියා කිරීම සඳහා ලබා දෙන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත සඳහන් නිවාස ආධාර ඉල්ලුම් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉල්ලුම්කරුවන් අතරින් නිවාස ආධාර ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සුදුසුකම් සපුරා ඇති ඉල්ලුම්කරුවන් සියල්ලන්ටම එම මුදල ලබා දෙනු ලබන දිනය කවරේද;

(iv) අලුත්වැඩියා කර ගැනීමට තරම්වත් නිවසක් නොමැති පැල්පත්වල ජීවත් වන වකුගඩු රෝගීන්ද සිටින බැවින්, ඔවුන්ට නිවසක් ඉදිකරදීමේ වැඩපිළිවෙළක් ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 ජූනි 06 වැනි බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

29/'18

ගරු හේෂා විතානගේ මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ලැබූ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එහි අද වනවිට පවතින ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iii) අධිකාරිය විසින් ලබා ගෙන ඇති කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය ආදියෙහි මුළු එකතුව කොපමණද;

(iv) අධිකාරිය විසින් පසුගිය රජය යටතේ සහ වර්තමාන රජය යටතේ සිදුකරන ලද ව්‍යාපෘතිවල ප්‍රතිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට යෝජිත නව ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

80/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ මාසික පරිභෝජනය සඳහා අවශ්‍ය බිත්තර ප්‍රමාණය කොපමණද;

(ii) මෙරට මාසික බිත්තර නිෂ්පාදනය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ ) (i) ශ්‍රී ලංකාවට බිත්තර ආනයනය කරනු ලබන රටවල් කවරේද;

(ii) මාසිකව ආනයනය කරනු ලබන බිත්තර ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවෙන් බිත්තර අපනයනය කරනු ලබන රටවල් කවරේද;

(iv) මාසිකව අපනයනය කරනු ලබන බිත්තර ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) බිත්තර නිෂ්පාදනය කරනු ලබන කුකුළු ගොවිපොළවල් වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ කවරේද;

(ii) බිත්තරයක නිෂ්පාදන පිරිවැය කොපමණද;

(iii) මේ වනවිට වෙළඳපොළේ බිත්තරයක තොග මිල කොපමණද;

(iv) බිත්තර නිෂ්පාදනය සහ අලෙවිය සඳහා රජයෙන් ලබා දී ඇති සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

136/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නියුක්තව සිටින මුළු නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන්ගේ නම්, තනතුරු නාම සහ සේවා ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) දැනට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා පුරප්පාඩු පවතින සේවා ස්ථාන කවරේද;

(iv) එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය විසින් තරඟ විභාග පවත්වා තිබේද;

(v) එසේ නම්, එම විභාගයෙන් සමත් වූ අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(vi) එම පිරිසට පත්වීම් ලබාදීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

194/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයන් විසින් සිදුකළ විදෙස් සංචාර සහ එම සංචාරවල අරමුණු;

(ii) එම එක් එක් සංචාරය සඳහා සහභාගී වූ පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ තනතුරු;

(iii) එම එක් එක් සංචාරය සඳහා වියදම් කළ මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

242/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් බොහෝ පිරිසකගේ නිවාසවලට හානි සිදු වී ඇති බවත්;

(ii) එසේ නිවාස හානි වූ පිරිසෙන් 220 දෙනෙකුට සිය නිවාස අතහැර දමා යන ලෙස දැනුම් දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නිවාස අතහැර යන ලෙස දැනුම් දී ඇති නිවාස හිමියන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) නිවාස අතහැර යැමට පෙර ඔවුන්ට ලබා දුන් පොරොන්දු මෙතෙක් ඉටු වී නොමැති බව දන්නේද;

(iii) පීඩාවට පත් 220ක් පමණ වූ නිවාස හිමියන්ගේ ගැටලුව විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

261/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී යාපනය දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

336/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් "අක්කර 500" ගමේ සිට කලාවැව, කුසලානගම දක්වා වූ කිලෝමීටර් 3ක් පමණ වූ මාර්ගය දැඩි ලෙස අබලන් වී ඇති බව දන්නේද;

(ii) එය කඩිනමින් නවීකරණය කිරීම සඳහා පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

373/'18

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු රහතැන්ගොඩ වතුයායේ 2002 වර්ෂයේදී සේවය කරන ලද වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2000 සිට 2015 දක්වා මෙම වතුයායේ සේවය කර විශ්‍රාම ගැන්වූ පිරිමි සහ කාන්තා වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ විශ්‍රාම ගැන්වූ කම්කරුවන් අතරින් මේ වනවිටත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්, සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ සහ විශ්‍රාම පාරිතෝෂිකය ගෙවා නොමැති කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කම්කරුවාගේ නම, ලියාපදිංචි සාමාජික අංකය, සේ.නි.භා.අරමුදල්, සේ.අ.අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂිකයේ හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

437/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018.06.30 දිනට බදු පදනම මත පිටස්තර පුද්ගලයන්ට ලබා දී ඇති ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා ලබා දී ඇති පුද්ගලයන්ගේ හා ආයතනවල නම, ලිපිනය, බදු දී ඇති කාලය, බදු දී ඇති ඉඩමේ ප්‍රමාණය හා බදු මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම ඉඩම් බදු දීමේදී විවෘත වෙළෙඳපොළ මිල ගණන් අනුව දේපළ තක්සේරු කර ඒ අනුව බදු මුදල් අය කිරීම සිදු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉඩම් බද්දට ලබා ගත් පුද්ගලයන් ඒවා අතුරු බදු දී ඇත්නම්, එම ඉඩම් කවරේද;

(ii) එසේ අතුරු බදු ලබා දුන් අයගේ නම, ලිපිනය, බදු දී ඇති කාලය, ඉඩමේ ප්‍රමාණය හා බදු මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) බදු අය කිරීම යාවත්කාලීන නොකිරීම හේතුවෙන් හා නීතිවිරෝධී අතුරු බදු දීම හේතුවෙන් පසුගිය වර්ෂ තුනේදී මණ්ඩලයට කොපමණ මුදලක් අහිමි වී තිබේද;

(iv) බදු ගිවිසුම ප්‍රකාරව අතුරු බදු දීමට එරෙහිව ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

449/'19

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගමට ක්‍රීඩාව ගෙනයාමේ අරමුණෙන් ක්‍රීඩා අමාත්‍යාංශ අරමුදලින් රුපියල් මිලියන 350ක් වැය කර නාවලපිටිය, ජයතිලක ක්‍රීඩාංගණය පිහිනුම් තටාකයක්, ගෘහස්ථ ක්‍රීඩාගාරයක්, ප්‍රේක්ෂකාගාරයක් හා ගෘහස්ථ බොක්සිං ක්‍රීඩාගාරයක් සහිත අංග සම්පූර්ණ ක්‍රීඩාංගණයක් ලෙස ඉදිකළ බව දන්නේද;

(ii) 2014 වර්ෂයේ අග භාගය වන තෙක් මෙම ක්‍රීඩාංගණය ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ නාවලපිටිය නගර සභාව විසින් මනාව නඩත්තු කළ බව පිළිගන්නේද;

(iii) පසුගිය වර්ෂ තුනක කාලය තුළ මෙම ක්‍රීඩාංගණයේ නඩත්තුවක්, අලුත්වැඩියාවක් හෝ නිසි කළමනාකරණයක් නොතිබුණු බව පිළිගන්නේද;

(iv) අනෙකුත් මෙවැනි ක්‍රීඩාංගණ ක්‍රීඩා අමාත්‍යාංශයට පවරාගෙන නඩත්තු කරන ආකාරයට මෙම ක්‍රීඩාංගණය ද ක්‍රීඩා අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

505/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බස්නාහිර පළාත් රෝහල්වල සායනික අපද්‍රව්‍ය මුල්ලේරියාව, සිසිලි හනාරෝ ආයතනයේදී පැය 24 පුරා දහනය කිරීමෙන් නිකුත් වන දුමාරයෙන් අවට වෙසෙන ජනතාවට 2004 වර්ෂයේ සිට පීඩා සිදු වන බවත්;

(ii) මෙම ආයතනය පිහිටුවීමේදී ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්ණායක සපුරා නොමැති බවත්;

(iii) මධ්‍යම පරිසර අධිකාරියේ බලපත්‍රය ලබා ගැනීමේදී ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයාගේ නිර්දේශය ලබා ගෙන නොමැති බවත්;

(iv) දැඩි ලෙස බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ප්‍රදේශයේ ජනතාවට සෞඛ්‍ය පීඩා ගෙන දෙන පරිසර දූෂණයක් මේ මඟින් සිදු වන බවට විද්‍යාත්මකව පරීක්ෂා කර පිළිගත් ඇගයීමක් පවතීද;

(ii) ජනතාවට සිදු වන පීඩාව අවම කිරීම පිණිස සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

(iii) නොඑසේ නම්, මෙම පීඩාව වැළැක්වීමට ගත හැකි කෙටිකාලීන හා දිගු කාලීන ක්‍රියාමාර්ග කවරේද;

(iv) ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්ණායකවලට අනුකූලව ශ්‍රී ලංකාව තුළ සායනික අපද්‍රව්‍ය දහනය කිරීමේ මධ්‍යස්ථානයක් නිර්මාණය කළ හැකිද;

(v) ඒ සඳහා රජය විසින් මේ වනවිට සැලසුම් සකස් කර තිබේද;

(vi) එසේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

566/’19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව විසින් බණ්ඩාරගම නගරයේ ආයුර්වේද බෙහෙත් ශාලාව පවත්වාගෙන යන ලද ස්ථානයේ බදුදීම සඳහා කඩ කාමර ඉදිකරනු ලැබුවේද;

(ii) එසේ නම්, ඉදිකරන ලද කඩ කාමර සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වැය වූ මුදල සහ මුදල් සපයන ලද්දේ කවුරුන් විසින්ද;

(iv) එම කඩ කාමර බදුදීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(v) එක් එක් කඩ කාමරය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ තැනැත්තන්ගේ නම, ලිපිනය, කඩ කාමර අංකය සහ ඉදිරිපත් කරන ලද මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එකී ටෙන්ඩරය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා,

(i) ගන්නා ලද ක්‍රියාමාර්ග;

(ii) දැන්වීම පළ කරන ලද එක් එක් පුවත්පත, දැන්වීමේ දිනය සහ දැන්වීම් ප්‍රමාණය;

(iii) බැනර් හෝ දැන්වීම් පුවරු මඟින් ප්‍රදර්ශනය කරන ලද්දේ නම්, එම ස්ථාන;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) උක්ත දැන්වීම්වල පිටපත් ඉදිරිපත් කරන්නේද?

(ii) ඉහත ටෙන්ඩර් කැඳවීම සඳහා ප්‍රමාණවත් ටෙන්ඩර්කරුවන් නොසිටි බව පිළිගන්නේද;

(iii) මෙම ගැටලුව විසඳා ගැනීම සඳහා එම කඩ කාමර සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමට නිර්දේශ කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

760/’19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ජනාධිපති කාර්ය මණ්ඩලයේ හිටපු ප්‍රධානී ආචාර්ය අයි. එච්. කේ. මහානාම සහ රාජ්‍ය දැව සංස්ථාවේ හිටපු සභාපති පී. දිසානායක යන මහත්වරුන් ඔවුන්ගේ රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන සේවයේ ආරම්භයේ සිට මේ දක්වා,

(i) දරා ඇති තනතුරු;

(ii) එකී තනතුරු දරන ලද කාලවකවානු;

(iii) එම තනතුරු දරමින් සේවය කර ඇති ආයතන;

(iv) එකී සේවා කාලවලදී ඔවුන්ට එරෙහිව විනය හෝ වෙනයම් චෝදනා ඉදිරිපත්ව තිබුණේ නම්, එම චෝදනා සහ ඒවාට එරෙහිව ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආචාර්ය අයි. එච්. කේ. මහානාම මහතාට ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි තනතුරට පත්වීමටත්, පී. දිසානායක මහතාට රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති තනතුර ලබා ගැනීමටත් නිර්දේශ ලබා දී ඇත්තේ කවුරුන්ද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

840/'19

ගරු කනක හේරත් මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සීතාවක ගඟ හරස් කර දැරණියගල ප්‍රදේශයේ ජලාශයක් ඉදි කිරීමට කටයුතු සූදානම් කර තිබේද;

(ii) එසේ නම්, මෙම ව්‍යාපෘතියේ අරමුණ කවරේද;

(iii) එමගින් මෙම ප්‍රදේශයේ නායයෑම් සහ ජල ගැලීම් අවම කළ හැකිද; ඒ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මකවීමෙන් දැරණියගල නගරයත් එහි පෞරාණික ස්ථාන, සංස්කෘතිකමය වටිනාකමක් සහිත ප්‍රදේශ, කෘෂිකාර්මික සහ අපනයන බෝග වගා විනාශ වීම තුළින් පාරම්පරික ජන ජීවිත අඩාල වීමක් සිදු නොවන්නේද?

(ii) මෙම ව්‍යාපෘතිය හේතුවෙන් පීඩාවට පත්වන ජනතාව නැවත පදිංචි කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

863/'19

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජී. එම්. ඩබ්ලිව්. එම්. ප්‍රේමතිලක මහතා සහ ඔහුගේ පරම්පරාව නිල්දණ්ඩාහින්න, උඩමාදුර, තලාව යන ඉඩමේ වසර 100 කට අධික කාලයක සිට පදිංචිව සිටින බවත්;

(ii) 1986 වසරේදී මොවුන් මෙම ඉඩමේ එක් තැනක මායිමේ ටර්පන්ටයින් ගස් 13 පමණ පැල කරන ලද බවත්;

(iii) එම කාලයේ දුම්කොළ සමාගම් විසින් මෙම ගස් ඔවුන්ට ලබා දී ඇත්තේ එදිනෙදා දර අවශ්‍යතාවයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමට බවත්;

(iv) මොවුන් පදිංචි ඉතාමත් පැරණි නිවසේ වහලය කඩාවැටීමට ආසන්න බැවින් එය සෙවිලි කර ගැනීම සඳහා වැඩී ඇති ටර්පන්ටයින් ගස් කීපයක් කපා ගැනීමට ප්‍රදේශයේ වන නිලධාරිවරයාගෙන් හා ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් අවසර ඉල්ලා ලිපි ගණනාවක් යොමුකර ඇතත්, මේ දක්වා එම ගස් කපා ගැනීමට අවසර ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් සොයාබලා ප්‍රේමතිලක මහතාට නිවස සාදා ගැනීම සඳහා ඔවුන් විසින් සිටුවන ලද ටර්පන්ටයින් ගස් 13 කපා ගැනීමට අවසර ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 ජූනි 07 වැනි සිකුරාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

24/'18

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ භාවිතාවන දුරකථන ජාලයන් හරහා සිදුවන දෙබස්වලට සවන්දීම හෝ පටිගත කිරීම සඳහා උපකරණ පද්ධතියක් රජය හෝ යම් ආයතනයක් විසින් මෙරටට ගෙන්වා හෝ ස්ථාපිත කර තිබේද;

(ii) එසේ නම්, එම පද්ධතියේ වටිනාකම කොපමණද;

(iii) එම පද්ධතිය මඟින් ආවරණය වන දුරකථන සංඛ්‍යාව කොපමණද;

(iv) එවැනි පද්ධතියක් ගෙන්වීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

79/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෙරට මාසික පරිභෝජනය සඳහා අවශ්‍ය කුකුල් මස් ප්‍රමාණය කොපමණද;

(ii) මෙරට මාසික කුකුල් මස් නිෂ්පාදනය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට කුකුල් මස් ආනයනය කරනු ලබන රටවල් කවරේද;

(ii) මාසිකව ආනයනය කරනු ලබන මස් ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවෙන් කුකුල් මස් අපනයනය කරනු ලබන රටවල් කවරේද;

(iv) මාසිකව අපනයනය කරනු ලබන මස් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මස් නිෂ්පාදනය කරනු ලබන කුකුළු ගොවිපොළවල් වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ කවරේද;

(ii) කුකුල් මස් කිලෝවක නිෂ්පාදන පිරිවැය කොපමණද;

(iii) මේ වනවිට වෙළඳපොළේ කුකුල් මස් කිලෝවක තොග මිල කොපමණද;

(iv) කුකුල් මස් නිෂ්පාදනය සහ අලෙවිය සඳහා රජයෙන් ලබා දී ඇති සහන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

143/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ කැළිකසළ සම්බන්ධව කටයුතු කරන ආයතන තිබේද;

(ii) එසේ නම්, එම ආයතනවල නම් හා ලිපිනයන් කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා එම ආයතනවල නිලධාරීන් කැළිකසළ කළමනාකරණය සම්බන්ධව පුහුණු වැඩසටහන්වලට සහභාගී වී තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා සහභාගී වූ නිලධාරීන්ගේ නම්, තනතුරු, වැඩමුළු පැවැති නගර හා වැය කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එසේ විදේශ පුහුණු ලැබූ නිලධාරීන්ගේ දැනුම හා අත්දැකීම් උපයෝගී කරගෙන කැළිකසළ කළමනාකරණය සඳහා අමාත්‍යාංශය ගත් පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

220/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඇස්බැස්ටෝස් භාවිතය තහනම් කිරීමට රජය තීරණය කළ දිනය කවරේද;

(ii) ඒ සඳහා බල පෑ හේතු කවරේද;

(iii) එම තහනම සඳහා රජය විසින් පදනම් කරගත් විද්වත් කමිටු හෝ විශේෂඥ වාර්තා කවරේද;

(iv) එම තහනම ඉවත් කිරීම සඳහා රජය තීන්දු කළ දිනය කවරේද;

(v) ඒ සඳහා බල පෑ හේතු කවරේද;

(vi) යළිත් ඇස්බැස්ටෝස් භාවිතය සුදුසු බව නිර්දේශ කළ විද්වතුන් හෝ විශේෂඥයන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

243/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උකුවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අල්කඩුව නම් නගරයක් තිබෙන බවත්;

(ii) එම නගරය තුළ පොදු වැසිකිළි හා ජල කරාම පද්ධතියක් වැනි පොදු පහසුකම් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, උකුවෙල නගරය දියුණු කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

251/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

342/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිරිමාගම නමැති ගම හා කලාවැව සම්බන්ධ කිරීම සඳහා පාලමක් ඉදිකිරීමට සැලසුම් කර මුල් ගල පිහිටුවා වර්ෂ ගණනාවක් ගත වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම කාර්යය ආරම්භ කිරීමට බලාපොරොත්තු වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

427/'19

ගරු කනක හේරත් මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වගා කර ඇති බිම් ප්‍රමාණය කොපමණද;

(ii) වර්ෂ 2015 සිට 2018 දක්වා මෙරට ගම්මිරිස් එලදාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 2015 සිට 2018 දක්වා අපනයනය කරනු ලැබූ ගම්මිරිස් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙරට නිෂ්පාදිත ගම්මිරිස්වලට වඩා වැඩි ප්‍රමාණයක් මෙම වර්ෂ තුළදී අපනයනය කර තිබේද;

(v) එසේ නම්, ශ්‍රී ලංකාව ගම්මිරිස් ආනයනය කරනු ලබන්නේද;

(vi) ශ්‍රී ලංකාව ගම්මිරිස් ආනයනය කරනු ලබන රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට ගම්මිරිස් ආනයනය කිරීම මඟින් මෙරට ගම්මිරිස් වගාව විනාශ වී යන අතර අහිංසක ගම්මිරිස් ගොවීන්ට අසාධාරණයක් සිදු කරමින් ඉහළ මට්ටමේ ව්‍යාපාරිකයන් කිහිපදෙනෙකුට පමණක් ප්‍රතිලාභ අත් වන බව දන්නේද;

(ii) ගම්මිරිස් කර්මාන්තය නැවත නඟා සිටුවීමට යම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්නේද;

(iii) එසේ නම්, එය කවරක්ද;

(iv) එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

435/’19

ගරු බිමල් රත්නායක මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018.07.31 දින නෙළුම් පොකුණ රඟහලේදී පැවැත්වූ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයාට ‘සුවපති කිරුළ’ පැළඳීමේ උපහාර උළෙල සංවිධානය කරන ලද ආයතනය කවරේද;

(ii) එම උළෙල සඳහා වැය වූ සම්පූර්ණ මුදල කොපමණද;

(iii) එම වියදම දරන ලද ආයතනය කවරේද;

(iv) අදාළ වියදම දරන ලද්දේ ආයතන කිහිපයක් විසින් නම්, එම එක් එක් ආයතනය ඉටුකළ කාර්ය හා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එවැනි උළෙලක් සංවිධානය කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

438/’19

ගරු ජයන්ත සමරවීර මහතා,— රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2018 දක්වා ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සේවකයන් වෙනුවෙන් ගෙවනු ලැබූ සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ඇතුළු ව්‍යවස්ථාපිත දීමනා සම්බන්ධ විස්තර වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(ii) මෙතෙක් ගෙවා නොමැති දීමනාවල එකතුව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත කී අරමුදල් සඳහා මුදල් නොගෙවීම සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් කාර්යාලය මඟින් පවරා ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

444/’19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය දැනට පිහිටා ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙන් බැහැරට ගෙන යෑමේ සූදානමක් තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) එම කාර්යාලයේ සිටින නිලධාරින්ගේ නම, තනතුර හා ජාතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2008 සිට මේ දක්වා ඉඩම් ගැටලු සම්බන්ධයෙන් විසඳුම් ලබා දී ඇති පුද්ගලයන් ඔවුන්ගේ ජාතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

450/'19

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාවලපිටිය නගර සංවර්ධන වැඩසටහන යටතේ නාවලපිටිය නගරයේ පොදු වෙළෙඳපොළක් ඉදිකර ඇති බව දන්නේද;

(ii) පොදු වෙළෙඳපොළ ඉදිකර ඇති භූමිය සඳහා සහ ඉදිකිරීම් කටයුතු සඳහා මුදල් වැයකරන ලද ආයතන කවරේද;

(iii) නාවලපිටිය නගර සභාව විසින් මෙම පොදු වෙළෙඳපොළ සඳහා ආරම්භක වර්ෂයේදී කඩහිමියන්ගෙන් අය කරන ලද වාර්ෂික බදු මුදල කොපමණද;

(iv) වත්මන් නගර සභාව විසින් වාර්ෂික බදු මුදල 1500%කින් වැඩිකර ඇති බව දන්නේද;

(v) එකවර 1500%කින් බදු මුදල් වැඩි කිරීමෙන් ව්‍යාපාරිකයන්ට එම බදු මුදල් ගෙවීමට නොහැකි බව පිළිගන්නේද;

(vi) මෙම තත්ත්වය සමාලෝචනය කර නැවත සාධාරණ බදු මුදලක් අය කිරීම සඳහා නාවලපිටිය නගර සභාවට උපදෙස් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

466/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය මාස 3 - 4 කාලය පුරා පුත්තලම දිස්ත්‍රික්කය දැඩි නියඟයකට මුහුණ දුන් බව දන්නේද;

(ii) එම නියඟය හේතුවෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ පොල් වගාවට දැඩි හානි සිදු වී ඇති බව පිළිගන්නේද;

(iii) නියඟයෙන් පීඩාවට පත් පුත්තලම දිස්ත්‍රික්කයේ පොල් වගා කරන්නන්ට යම් සහනයක් හා ආධාර ලබා දීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

468/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ පවතින,

(i) අභ්‍යන්තර ගුවන් තොටුපොළ සංඛ්‍යාව;

(ii) අභ්‍යන්තර ගුවන් තොටුපොළවල් පිහිටා ඇති ස්ථාන;

(iii) අභ්‍යන්තර ගුවන් ගමන් සඳහා භාවිතා වන ගුවන් යානා සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) යහපාලන රජය බලයට පත් වූ දින සිට මේ දක්වා අභ්‍යන්තර ගුවන් ගමන් පහසුකම් වර්ධනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) සංචාරක ආකර්ෂණය වැඩි කිරීම සඳහා හා එවැනි ආකර්ෂණයක් ඇති ස්ථානවලට ප්‍රවේශ වීම පහසු වීම සඳහා කේබල් යානා භාවිතය විදේශ රටවල් තුළ දැකිය හැකි බැවින් ශ්‍රී ලංකාව තුළ ද එවැනි,

(i) කේබල් යානා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් තිබේද;

(ii) එම යානා යෙදවිය හැකි ස්ථාන හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම ස්ථාන කවරේද;

(iv) මෙම ව්‍යාපෘති ආරම්භ කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

506/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හිටපු මහබැංකු අධිපති, අජිත් නිවාඩ් කබ්රාල් මහතාගේ නැගණිය වන ශිරෝමනී වික්‍රමසිංහ මහත්මිය, ලංකාපුත්‍ර බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරිනිය ලෙස කටයුතු කළ සමයේ දූෂණ හා වංචා සිදුවී තිබෙන බව ප්‍රයිස් වෝටර්හවුස් කූපර්ස් විගණන ආයතනය විසින් හෙළිදරව් කර ඇති බවත්;

(ii) වර්ෂ 2006 සිට 2014 දක්වා බැංකු පනත උල්ලංඝනය කරමින් දේශපාලන හිතවතුන්ට ණය ලබාදී ඇති බවත්;

(iii) නැවත ගෙවීමේ හැකියාව පිළිබඳ නොසලකා රජයේ ඉඩම්, පන්සල් සතු ඉඩම්, මුඩු ඉඩම් සහ මැණික් ලෙස හඟවා තිරුවානා ගල් යනාදිය ඇපයට තබා ණය ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ ආකාරයෙන් ණය ලබාගෙන ඇති පුද්ගලයන් සහ ආයතන කවරේද;

(ii) එම එක් එක් පුද්ගලයන් සහ ආයතන ලබාගත් ණය මුදල කොපමණද;

(iii) මේ වනවිට එම ණය මුදල්වලින් නැවත ගෙවා ඇති ප්‍රමාණය කොපමණද;

(iv) මෙලෙස ණය ලබා දීමට අනුමතිය ලබා දුන් එවකට ප්‍රධාන විධායක නිලධාරිනිය ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(v) එසේ නම්, එහි ප්‍රගතිය කවරේද;

(vi) නොඑසේ නම්, මේ සම්බන්ධව විධිමත් නීතිමය ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 11 /'18

ගරු වමින්ද විජේසිරි මහතා,— ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල් ඉතා අඩු ආර්ථික මට්ටමක පවතින බැවින්, එවැනි පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'19

ගරු මුහම්මදු නසීර් මහතා,— හජ් වන්දනා පනතක් හඳුන්වා දීම,— වාර්ෂිකව හජ් වන්දනාවේ යෙදෙන ශ්‍රී ලාංකික බැතිමතුන් විසින් මුහුණ දෙන ගැටලු නිරාකරණය කර ගැනීමටත්, ඒ පිළිබඳ ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කොට නීතිමය ප්‍රතිපාදන සකස් කිරීමටත්, රජය මගින් "හජ් වන්දනා පනතක්" හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අයහපත් කාලගුණය නිසා ඇතිවන වසංගත තත්ත්වයන් ව්‍යාප්තවීම වැළැක්වීම,— අයහපත් කාලගුණය නිසා ඇතිවන ජල ගැලීම් වලින් පසුව ආපදාවට ලක්වූ ප්‍රදේශවල ජලය බැස යාමත් සමඟ මී උණ, පාචනය ඇතුළු බෝවන රෝග පැතිරයාමේ අවදානමක් පවතින බවට අදාළ ප්‍රදේශවල මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු විසින් පෙන්වා දී ඇති බැවින්, එවැනි වසංගත තත්ත්වයන් ඇතිවීම වැළැක්වීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය තුළ ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීම,— ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ප්‍රෝටීන් ලබාදීමටත්, වාර්ෂිකව ටින් මාළු ආනයනය වෙනුවෙන් විදේශ රටවල් කරා ඇදී යන විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම සඳහා මෙන්ම, ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය සියලුම සම්පත් පුත්තලම දිස්ත්‍රික්කය තුළ පවතින බැවින් ද, එම දිස්ත්‍රික්කය තුළ ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුකුළු ගොවිපළ හිමියන් භාවිතා කරන බැටරි කේජ් ක්‍රමය නවත්වාලීම,— ශ්‍රී ලංකාව අතීතයේ පටන්ම සත්ව කරුණාව පතුරුවාලන බෞද්ධ රටක් වුවද, අද වනවිට සමහර කුකුළු ගොවිපළ හිමියන් භාවිතා කරන බැටරි කේජ් ක්‍රමය නිසා සතුන් දැඩි හිංසාවකට ලක්වීමත්, අධික බිත්තර නිෂ්පාදනය තුළින් සුළු පරිමාණ කුකුළු ගොවිපළ හිමියන්ගේ රැකියා අනතුරුදායක තත්ත්වයකට පත්ව ඇති බැවින්, මෙම අති අමානුෂීය ක්‍රමය නවත්වාලීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 42/'19

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ආපදා අවම කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් නිකුත් කරන ලද වාර්තාවන්ට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ආපදා තත්ත්වයන්ට ලක්වීමේ අවදානමක් සහිත ස්ථාන රාශියක් ඇති බව පෙන්වා දී ඇති බැවින්, එම තත්ත්වයන් අවම කිරීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 43/'19

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— අන්තර්ජාලය තුළ අසභ්‍ය වීඩියෝ පට සංසරණය වීම වැළැක්වීමෙහිලා විශේෂ ඒකකයක් පිහිටුවීම,— වර්තමානයේ බහුල වශයෙන් අන්තර්ජාලය ඔස්සේ නොයෙකුත් අසභ්‍ය වීඩියෝ දර්ශන සංසරණය වීම මඟින් පුද්ගලයන්ගේ පුද්ගලිකත්වය විනාශවන අතර විශේෂයෙන්ම, කාන්තා පාර්ශ්වය එමඟින් විශාල අපහසුතාවයකට පත්වන බැවින්, මෙවන් වීඩියෝ දර්ශන ළඟ තබාගෙන සිටින, බෙදා හරින හා නිර්මාණය කරන පුද්ගලයන් පිළිබඳව විමර්ශනය කිරීමට ප්‍රතිඵලදායී විශේෂ ඒකකයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 45/'19

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මොරටුව විශ්වවිද්‍යාලය සඳහා යෝජිත වෛද්‍ය පීඨය සඳහා ශික්ෂණ රෝහල ලෙස නාගොඩ මහ රෝහල සංවර්ධනය කිරීම,— 2018 අයවැය මඟින් මොරටුව විශ්වවිද්‍යාලයට අනුබද්ධව වෛද්‍ය පීඨයක් ඉදිකිරීමට යෝජනා කර ඇති අතර එම යෝජිත වෛද්‍ය පීඨය සඳහා ශික්ෂණ රෝහල ලෙස නාගොඩ මහ රෝහල සංවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 46/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම,— ශිෂ්ට සම්පන්න සමාජයකට නොගැලපෙන අයුරින් රට තුළ ව්‍යාප්ත වන අපචාර හා බාල අපරාධ මර්දනය කිරීම හා ස්වයං විනයක් ඇති කිරීම උදෙසා සියලුම දරුවන්ට, 9 ශ්‍රේණිය දක්වා ඔවුන්ගේ ආගමට අනුකූල දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට යාන්ත්‍රණයක් සකස් කිරීම,— රටක සංවර්ධනය සඳහා තොරතුරු වැදගත් සාධකයක් වන අතර, එම තොරතුරු සම්පාදනයේදී වැදගත් මෙහෙවරක් ඉටුකරන ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට යාන්ත්‍රණයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහනුවර දිස්ත්‍රික්කයේ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය භූගෝලීය වශයෙන් සලකා බලන කල මුහුදු සීමාවෙන් දුරස්ථව පිහිටා ඇති බැවින්, එම දිස්ත්‍රික්කයේ ජීවත්වන ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාව සපුරාලීම සඳහා මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි සියලු වැව් හා ජලාශවල මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහනුවර දිස්ත්‍රික්කය තුළ පයිනස් වගාව හේතුවෙන් සිදුවී ඇති පරිසර හානිය අවම කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ පයිනස් වගාව හේතුවෙන් පරිසරයට දැඩි හානියක් සිදුවී ඇති බැවින්, එම පරිසර හානිය අවම කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා, — මහනුවර රෝහල් පරිශ්‍රයේ ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම,— යහපාලන රජය යටතේ මහනුවර රෝහල දෙවැනි ජාතික රෝහල ලෙස දියුණු කිරීමට පියවර ගනිමින් සිටින බැවින්, එම රෝහල් පරිශ්‍රයේ ඇති සියලු අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කඩිනමින් පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— ගංගා ද්‍රෝණි පද්ධතියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම,— කෘෂිකාර්මික රටක් වන අප රටෙහි ගංගා ද්‍රෝණි පද්ධතියෙන් කෘෂි කර්මාන්තයට විශාල සේවාවක් ඉටුවන නමුදු, මෙම ගංගාවල ජලයෙන් විශාල ප්‍රමාණයක් භාවිතයට නොගෙන මුහුදට ගලා බසින බව විද්වත් පර්යේෂණ මඟින් පවා හෙළි වී ඇති බැවින්, මහා පරාක්‍රමබාහු රජ සමයේදී මෙන් මෙම ජල සම්පතෙන් රටේ සංවර්ධනයට උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි ආකාරයේ වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහනුවර දිස්ත්‍රික්කයේ ජූඩෝ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම,— මහනුවර දිස්ත්‍රික්කයේ ජූඩෝ ක්‍රීඩාවට දක්ෂතා දක්වන විශාල පිරිසක් සිටින බැවින් එම පිරිස ජාත්‍යන්තර තලයට ගෙන යාමට හැකිවන අයුරින් මහනුවර දිස්ත්‍රික්කයේ ජූඩෝ ක්‍රීඩාව ප්‍රවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය සතුව තිබූ වොලිබෝල් ක්‍රීඩාවේ අභිමානය නැවත ගොඩනැගීමට වැඩසටහනක් දියත් කිරීම,— මීට දශකයකට පමණ පෙර පුත්තලම දිස්ත්‍රික්කයේ පාසල් වලින් බිහිවූ දක්ෂ වොලිබෝල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර තරඟ වලදී දැක්වූ දක්ෂතා නිසා පුත්තලම දිස්ත්‍රික්කයට වොලිබෝල් ක්‍රීඩාවෙන් ඉතා අභිමානවත් ස්ථානයක් හිමි වුවද, අද වනවිට එම තත්ත්වයේ යම් බිඳ වැටීමක් ඇති බැවින්, නැවත එම අභිමානය පුත්තලම දිස්ත්‍රික්කයට ගෙන ඒමට වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හලාවත දක්වා දීර්ඝ කිරීම,— රටක සංවර්ධනය සඳහා අධිවේගී මාර්ග ඉතා වැදගත් වන බැවින් ද, යහපාලන රජය යටතේ පුත්තලම දිස්ත්‍රික්කය ඉතා වේගයෙන් සංවර්ධනය වන බැවින් ද, එම සංවර්ධන වේගය තවදුරටත් ඉහළ නැංවීම සඳහා දැනට කොළඹ සිට කටුනායක දක්වා වූ අධිවේගී මාර්ගය හලාවත දක්වා දීර්ඝ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා, — වයඹ පළාතේ වැව්, ගංඟා සහ ඇළ මාර්ග ආශ්‍රිතව කුඹුක් ශාඛ සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම,— පසේ පවතින ජලය ආරක්ෂා කිරීමේ හැකියාව මෙන්ම, පාංශු ඛාදනය අවම කිරීමේ ගුණාංග සහිත වූ දිගු ආයු කාලයක් ඇති කුඹුක් ශාඛ, වයඹ පළාතේ වැව්, ගංඟා සහ ඇළ මාර්ග ආශ්‍රිතව සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— බත්තලංගුණ්ඩුව දූපත්වාසී ධීවර ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා කඩිනම් පියවර ගැනීම,— වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය අර්ධද්වීපය අසල ඇති ප්‍රධාන දූපතක් වන බත්තලංගුණ්ඩුව දූපතේ ධීවර ප්‍රජාවගේ මූලික අවශ්‍යතා පිළිබඳව මෙතෙක් නිසි අවධානයට ලක් නොවී ඇති බැවින්, යහපාලන රජය යටතේ එම ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරා දී ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා කඩිනම් පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය තුළ ජලජ පැළෑටි වගා කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම,— වර්තමානයේ ලෝකයේ ජලජ පැළෑටි සඳහා විශාල ඉල්ලුමක් පවතින අතර, එමඟින් අපේ රටට විදේශ විනිමය උපයා ගැනීමේ පුළුල් අවස්ථාවක් උදා වී ඇති අතර, මෑතකදී ජපන් විශේෂඥයන් විසින් සිය පර්යේෂණ වාර්තාවක ජලජ පැළෑටි වගාව සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරය ආශ්‍රිත ප්‍රදේශය ඉතා යෝග්‍ය බව පෙන්වා දී ඇති පසුබිමක ජලජ පැළෑටි වගා කිරීමේ ව්‍යාපෘතියක් පුත්තලම දිස්ත්‍රික්කය තුළ ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වයඹ පළාත තුළ පිළිකා රෝහලක් ස්ථාපිත කිරීම,— වයඹ පළාත තුළ මේ වනවිට පිළිකා රෝගීන් සංඛ්‍යාව විශාල ලෙස ඉහළ ගොස් ඇති බැවින්, එම රෝගී ජනතාව වෙනුවෙන් වයඹ පළාත තුළ පිළිකා රෝහලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වයඹ පළාත තුළ ළමා රෝහලක් ස්ථාපිත කිරීම,— ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ළමා රෝහල වන රිජ්වේ ආර්යා ළමා රෝහලේ පවතින දැඩි තදබදය අවම කිරීම සඳහා මෙන්ම, වයඹ හා උතුරු මැද පළාතේ ජනතාවට ප්‍රයෝජනවත් වන පරිදි වයඹ පළාත තුළ ළමා රෝහලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කයේ හෝටල් පාසලක් ස්ථාපිත කිරීම,— යහපාලන රජය යටතේ පුත්තලම දිස්ත්‍රික්කය සංචාරක කලාපයක් ලෙස දියුණු කිරීමට අපේක්ෂා කරන බැවින්, එම කර්මාන්තයේ දියුණුව සඳහා අවශ්‍ය මානව සම්පත පුහුණු කිරීම සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ හෝටල් පාසලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා, — කල්පිටිය ආශ්‍රිතව තල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම,— වයඹ පළාතේ කල්පිටිය ප්‍රදේශයේ තල් ආශ්‍රිත කර්මාන්ත පසුගිය වසර කිහිපය තුළ දරුණු කඩා වැටීමකට ලක් වී ඇති බැවින්, වත්මන් රජයේ ප්‍රතිපත්තිවලට අනුව, ඉදිරියේදී කල්පිටිය ප්‍රදේශය සංචාරක පුරවරයක් වශයෙන් සංවර්ධනය කිරීමේ වැඩසටහනට සමගාමීව එම ප්‍රදේශයේ තල් කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් ද දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කිරි කර්මාන්තයේ නියුක්ත දේශීය කිරි ගොවීන්ගේ ගැටලු විසඳීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— වාර්ෂිකව කිරි පිටි ආනයනය සඳහා විශාල මුදලක් වැයවන අතර එම මුදල් අප රට තුළම ඉතිරි කරගත හැකිනම්, එය රටේ ආර්ථිකයට විශාල පිටුබලයක් වන බැවින්, කිරි කර්මාන්තයේ නියුක්ත දේශීය කිරි ගොවීන්ගේ ගැටලු විසඳීමට කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාත තුළ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය ඉතා ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන රැසක් සහිත දිස්ත්‍රික්කයක් වන අතර අතීතයේදී කුරුණෑගල, දඹදෙණිය සහ යාපහුව වැනි රාජධානි පිහිටා තිබුණේද කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ වුවත්, අද වනවිට එම පෞරාණික ස්ථානවල ආරක්ෂාව සම්බන්ධයෙන් බලවත් ගැටලු මතුවී ඇති බැවින්, එම පුරාවිද්‍යාත්මක ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කිරීම,— ඕනෑම රටක සාර්ථක සමාජ ආරක්ෂණ ජාලයක් පැවතීම එම රටේ ජීවත් වන පුරවැසියන්ට වැදගත් වන අතර ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හෝ අර්ථ සාධක ක්‍රමයක් ක්‍රියාත්මක වුවද, රටේ අවිධිමත් අංශයේ සේවකයන් සඳහා කිසිදු සමාජ ආරක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක නොවන බැවින්, සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාත තුළ වකුගඩු රෝගීන් සඳහා රෝහලක් ස්ථාපිත කිරීම,— වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ මෑත කාලීනව විශාල ලෙස වකුගඩු රෝගය පැතිරීම ඉහළ ගොස් ඇති බැවින්, එම රෝගීන් වෙනුවෙන් වයඹ පළාත තුළ රෝහලක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ තැලසීමියා රෝගීන් සඳහා රෝහලක් ස්ථාපිත කිරීම,— මෑතකාලීනව ශ්‍රී ලංකාවේ වැඩිම තැලසීමියා රෝගීන් වාර්තා වී ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන අතර, තවමත් එම රෝගීන්ට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා වෙනම රෝහලක් ස්ථාපිත කර නොමැති බැවින්, එම රෝගීන් සඳහා වෙනම රෝහලක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාතේ ගරා වැටෙමින් තිබෙන විහාරස්ථාන සංවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ වැඩිම විහාරස්ථාන සංඛ්‍යාවක් පිහිටා ඇති, ස්වාමීන්වහන්සේලා වැඩිම ප්‍රමාණයක් වැඩ සිටින, බෞද්ධයන් වැඩිම පිරිසක් වාසය කරන හා ශාසනාරක්ෂක බල මණ්ඩල වැඩිම සංඛ්‍යාවක් ක්‍රියාත්මකව පවතින වයඹ පළාතෙහි ගරා වැටෙමින් තිබෙන විහාරස්ථාන සංවර්ධනය කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 37/'19

ගරු හේෂා විතානගේ මහතා,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් බණ්ඩාරවෙල, ලියන්ගහවෙල ප්‍රදේශයේ නිවාස, ඉඩම් ඇතුළු දේපළ අහිමි වූ පවුල් සඳහා සහන සලසාදීම,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා භූගත උමං මාර්ග කැණීම හේතුවෙන් බණ්ඩාරවෙල, ලියන්ගහවෙල ප්‍රදේශයේ ජනතාවට සිය නිවාස, ඉඩම් ඇතුළු දේපළ අහිමි වී මේ වනවිට වසර තුනක කාලයක් ගතවී තිබුණ ද, අවතැන් වූ එම ජනතාවට මෙතෙක් කිසිදු වන්දි මුදලක් හෝ සහනයක් ලැබී නොමැති බැවින්, එම ජනතාවට සහන සලසා දීමේ වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 38/'19

ගරු හේෂා විතානගේ මහතා,— දුම්රිය මඟින් එළවළු ප්‍රවාහනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම,— බදුල්ල දිස්ත්‍රික්කය ඇතුළු එළවළු නිෂ්පාදනය කරන දිස්ත්‍රික්කවල සිට එළවළු ගොවීන්ගේ නිෂ්පාදන අඩු පිරිවැයකින්, අපතේ යෑම අවම කරමින් දුම්රිය මඟින් රටේ සෙසු ප්‍රදේශවල වෙළෙඳපොළ වෙත ප්‍රවාහනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 39/'19

ගරු හේෂා විතානගේ මහතා,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ජල හිඟයකට මුහුණ දී සිටින ජනතාවට ජල පහසුකම් ලබාදීම,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් මේ වනවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07ක පවුල් 8394ක ජනතාවට උග්‍ර ජල හිඟයකට මුහුණ පෑමට සිදුවී ඇති බැවින්, එම ජනතාවට අවශ්‍ය ජල පහසුකම් ලබාදීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 40/'19

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම,— අයහපත් කාලගුණය සහිත කාලසීමාවන්වලදී නිරන්තරයෙන්ම ගංවතුරින් ආපදාවට ලක්වන රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීමට වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/'19

ගරු හේෂා විතානගේ මහතා,— අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කිරීම,— කලාව, ක්‍රීඩාව ආදී බොහෝ අංශවල සබරගමුවට උරුම ආවේණික ලක්ෂණ ඇති අතර අද වනවිට වාණිජකරණය හමුවේ එම ආවේණික ලක්ෂණ අභාවයට යාමේ අවදානමක් ඇති බැවින්, අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කර ගැනීමේ වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'19

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— විශ්වවිද්‍යාල හා අනෙකුත් සියලුම උසස් අධ්‍යාපන ආයතනවලට විශේෂ පුහුණුවලත් මානසික උපදේශකවරු හෝ අනුශාසකවරු පත්කිරීම,— වර්තමානයේ බහුල වශයෙන් දක්නට ලැබෙන තරුණ තරුණියන්, සිසු සිසුවියන් සියදිවි හානිකර ගැනීමේ ප්‍රවණතාවය මැඩපැවැත්වීම සඳහා සියලුම රජයේ අධ්‍යාපන ආයතන සඳහා පුහුණුවලත් මානසික උපදේශකවරු, අනුශාසකවරු හෝ එම අධ්‍යාපන ආයතනවල දැනට සිටින ගුරුවර ගුරුවරියන්ට මානසික උපදේශනය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 47/'19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— කොළොන්නාව මහ නගර සභාව ස්ථාපිත කිරීම,— කොළඹ නගරය සහ එහි තදාසන්න නගර පරිපාලනය සඳහා කොළඹ, කඩුවෙල සහ කෝට්ටේ යනුවෙන් මහ නගර සභා තුනක් පැවතිය ද, මෙම මහ නගර සභා බල ප්‍රදේශ තුනටම මායිම්ව ඇති කොළොන්නාව මැතිවරණ කොට්ඨාසය පාලනය වන්නේ ප්‍රාදේශීය පරිපාලන ඒකක දෙකක් වන කොළොන්නාව නගර සභාව සහ කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව යටතේ වන බැවින්, සමස්ත කොළොන්නාව මැතිවරණ කොට්ඨාසයේම ආර්ථික, සමාජයීය හා සංස්කෘතික විෂමතාවන් ඇති කිරීමට මෙය හේතු වී ඇති අතර, අවට පවතින මහ නගර සභා, පරිපාලනයේ කාර්යක්ෂමතාව මත ශීඝ්‍ර සංවර්ධනයක් මේ වනවිට ළඟා කර ගෙන ඇති බැවින්, සමස්ත කොළොන්නාව මැතිවරණ කොට්ඨාසයේම සංවර්ධනය අරමුණු කර ගනිමින් කොළොන්නාව නගර සභාව සහ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව ඒකාබද්ධ කර කොළොන්නාව මහ නගර සභාව ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 49/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— බුලත් වගාව නඟා සිටුවීම,— ගම්පහ සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල විශාල පිරිසකගේ ජීවනෝපාය වන බුලත් වගාව, රටට විදේශ විනිමය ගෙන එන කෘෂිකාර්මික බෝගයක් වන අතර, ශ්‍රී ලංකාවෙන් බුලත් මිලදී ගන්නා ප්‍රධාන රටක් වන පාකිස්ථානය මෑතකදී එරටට ආනයනය කරන බුලත් සඳහා පනවන ලද බදු මෙන්ම, වගාවට දේශීයව බලපාන්නා වූ කරුණු ගණනාවක් හේතු කොට ගෙන දේශීය බුලත් මිල ඉතාමත් පහළ මට්ටමකට වැටී ඇති පසුබිමක බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ කටයුතු ද අක්‍රමවත් වී ඇති බැවින්, මෙම තත්ත්වයන් හමුවේ අසීරුතාවයට පත්වී සිටින බුලත් ගොවීන් නඟා සිටුවීමටත්, අවශ්‍ය අපනයන දිශාවන් සොයා ගැනීමටත් අවශ්‍ය රාජ්‍ය මැදිහත් වීම වඩා කාර්යක්ෂම කිරීම මඟින් බුලත් වගාව නඟා සිටුවීම සඳහා පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 50/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ණය තොරතුරු කාර්යාංශය මඟින් අසාදු ලේඛනගත ඇපකරුවන් එම ලේඛනයෙන් නිදහස් කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වාණිජ බැංකු මඟින් රටේ පුරවැසියන්ට විවිධ වූ අවශ්‍යතාවයන් සඳහා ණය ලබා දීමේදී දේපළ ඇප මෙන්ම, පුද්ගල ඇප ද තබා ගන්නා අතර මෙහිදී ඇපකරු ණයගැතියා වෙත සිදුකරන්නේ උපකාරයක් වුවත්, යම් හෙයකින් ණයගැතියා ණය ගෙවීම පැහැර හැරියහොත්, ණයගැතියා ඇතුළුව ඇපකරුවන්ගේ නම් ද ණය තොරතුරු කාර්යාංශය මඟින් අසාදු ලේඛනයට ඇතුළත් කිරීමෙන් ඇපකරුට බලවත් අසාධාරණයක් සිදුවන අතර ගනුදෙනුව සමථයකට පත්වන තුරු ඇපකරුට බැංකු ණයක් ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් හමුවේ රටේ නව ව්‍යවසායකයන් බිහිවීමට මෙන්ම, දළ ජාතික නිෂ්පාදිතයට ද අහිතකර ලෙස බලපෑම් සිදුවිය හැකි බැවින් ඇපකරුවන් සම්බන්ධයෙන් ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කර ණය තොරතුරු කාර්යාංශය මඟින් අසාදු ලේඛනගත ඇපකරුවන් එම ලේඛනයෙන් නිදහස් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 51/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන උසස් ප්‍රමිතියකින් යුතුව පවත්වා ගෙන යෑමේ අරමුණින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට සංශෝධන හඳුන්වා දීම,— ශ්‍රී ලංකාව තුළ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන විශාල වශයෙන් පිහිටුවීමේ ප්‍රවණතාවයක් ඇති අතර ක්‍රමවත් අධ්‍යාපනය රටක සංවර්ධනයට උපකාරී වන බැවින්, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල බිහිවීම පැති කිහිපයකින්ම රටට හිතකර වන නමුත් මෙම ආයතනවලින් ලබාදෙන සේවාවේ ගුණාත්මකභාවය ආරක්ෂා වන පරිදි පිළිගත් ප්‍රමිතියකින් යුතුව ලබාදීම ඉතා වැදගත් බැවින් පළපුරුදු විද්වතුන්ගේ හා අධ්‍යාපනඥයන්ගේ මැදිහත් වීම තුළින් අදාළ පාඨමාලාවල අන්තර්ගතය විමසුමකට ලක්කරමින් පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලින් සිදුවන සේවාව උසස් ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම සඳහා දැනට පවතින නීති පද්ධතිය ශක්තිමත් නොවන හෙයින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට සංශෝධන හඳුන්වා දීම කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 52/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— පෞද්ගලික මූල්‍ය ආයතන පවත්වාගෙන යාමට අදාළ පනත් සංශෝධනය කිරීම තුළින් තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම,— පෞද්ගලික මූල්‍ය ආයතනවල මුදල් තැන්පත් කිරීමේදී තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ ගැටලු මතුවන අවස්ථා ඇති බැවින්, තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව තහවුරු වන පරිදි මූල්‍ය සමාගම්වල ව්‍යාපාරික කටයුතු සිදුකර ගෙන යාමට ප්‍රමාණවත් නීති ප්‍රතිපාදන ශක්තිමත් නොවන හෙයින්, 2007 අංක 7 දරන සමාගම් නීතිය සංශෝධනය කොට බුන්වත් නීතිය ශක්තිමත් කිරීම කඩිනමින් සිදුකර ඊට සහාය සඳහා 2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත, 2011 අංක 1 සහ 19 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් සංශෝධනය කිරීම තුළින් රට තුළ ශක්තිමත් මූල්‍ය අංශයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 53/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— නිසි ප්‍රමිතියෙන් යුතුව සුළු අපනයන බෝග නිෂ්පාදනය කිරීම,— සුළු අපනයන බෝග නිෂ්පාදනය නිසි ප්‍රමිතියෙන් තොරව සිදුකිරීම මඟින් වගාකරුවන්ට මෙන්ම, රටට ද අහිතකර ලෙස බලපෑම් ඇතිවන අතර, රජයේ ආදායම වැඩිකර ගැනීම සඳහා අපනයන වැඩිකර ගැනීම උපකාරී වන නමුත්, ශ්‍රී ලංකාවේ සුළු අපනයන බෝගවලට ජාත්‍යන්තරයේ තිබූ ඉහළ කීර්ති නාමය ගොරකාවලට යූරියා මිශ්‍ර කිරීම වැනි කූට ක්‍රම හේතුවෙන් පළුදු වී ඇති අතර මෙරට නිෂ්පාදිත සුළු අපනයන බෝග සඳහා ඇති විදේශීය ඉල්ලුම අඩුවීමෙන් දේශීය මිල ද පහත වැටී ඇති පසුබිමක මෙම තත්ත්වය වහා වෙනස් කර නිෂ්පාදනය කරන සුළු අපනයන බෝගවල ප්‍රමිතිය ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 54/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ව්‍යවසායකත්ව බැංකු ක්‍රමය හඳුන්වාදීම සහ ස්ථාපිත කිරීම,— දිවයිනේ ඇති වාණිජ බැංකු මඟින් සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන් දිරිගැන්වීමෙහිලා ලබා දෙන මූල්‍ය අනුග්‍රහය ප්‍රමාණවත් නොවන බැවින් ලෝකයේ දියුණු රටවල භාවිතා වන ව්‍යවසායකත්ව බැංකු ක්‍රමය ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම මඟින් නව ව්‍යවසායකයන් බිහිවීමේ ප්‍රවණතාවය ඉහළ යා හැකි අතර නව අදහස් සමඟ බැංකුවට පැමිණෙන තරුණ ව්‍යවසායකයන්ගේ අවශ්‍යතාව තේරුම් ගෙන ඔවුනට මූල්‍ය පහසුකම් පමණක් නොව ව්‍යාපාරික දැනුම හා නිරන්තර රැකවරණය ලබා දීම මෙම බැංකු ක්‍රමයේ ඇති විශේෂතා වන අතර, එමඟින් රැකියා උත්පාදනය සමඟ ජාතික නිෂ්පාදිතය වැඩිවීමෙන් රටේ සංවර්ධනයට ද උපකාරී වන බැවින් ව්‍යවසායකත්ව බැංකු ක්‍රමය ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 55/’19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන අධීක්ෂණයට භාජනය කිරීම,— දිවයිනේ බොහෝ ස්ථානවල ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන වැඩි වැඩියෙන් බිහිවීමේ ප්‍රවණතාවයක් ඇති අතර ව්‍යවසායකයන් බිහිවීම රටට හිතකර වුවත්, එයින් සමාජයට යහපතක් සිදුවිය යුතු බැවින්, බොහෝ ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථානවල සිදුවන විෂමාචාර ක්‍රියා වැළැක්වීම සඳහා මෙන්ම, එමගින් සමාජයීය වශයෙන් ප්‍රතිලාභ සහිත හිතකර තත්ත්වයක් ඇති කිරීම සඳහා මෙම ආයතන ලියාපදිංචි කිරීමට බලය ඇති ආයතන සහ පලාත් පාලන ආයතන මගින් ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන නිරන්තර අධීක්ෂණයට භාජනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 56/’19

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා, — “ඉන්දියානු දෙමළ” ශීර්ෂය යටතේ සංගණනයට භාජනය වූ ජන කොටස ඉදිරි සංගණන වලදී “කඳුරට දෙමළ” ශීර්ෂය යටතේ සංගණනය කිරීම,— ඉන්දියාවෙන් මෙරටට රැගෙන එන ලද ඉන්දියානුවන් “ඉන්දියානු දෙමළ” ශීර්ෂය යටතේ සංගණනයට භාජනය කෙරෙන අතර වර්තමානයේදී ඔවුන් “කඳුරට දෙමළ” ලෙස තමන්ව හඳුන්වා ගනිමින් ශ්‍රී ලාංකික පුරවැසිභාවය පූර්ණ වශයෙන් භුක්ති විඳින නමුත් “ඉන්දියානු දෙමළ” ලෙස හැඳින්වීමෙන් ඔවුන්ගේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රශ්න කෙරෙන ස්වභාවයක් ඇති බැවින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ඉදිරියට සිදුකෙරෙන සංගණනවලදී මෙම ජන කොටස “කඳුරට දෙමළ” ශීර්ෂය යටතේ සංගණන කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 57/’19

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ශ්‍රී ලංකාවේ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් උගන්වන අංශයක් ආරම්භ කිරීම,— ජාතික සංහිඳියාව හා ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ එකමුතුව වඩාත් ඵලදායී ලෙස ගොඩනැගීම සඳහා දීර්ඝ කාලීන ඉලක්කයන්ට මුල පිරීමේ අරමුණින්, ශ්‍රී ලංකාව තුළ සෑම දෙමළ මාධ්‍ය පාසලකම සිංහල මාධ්‍යයෙන් උගන්වන අංශයක් ආරම්භ කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 58/’19

ගරු ජයන්ත සමරවීර මහතා,— ශ්‍රී ලංකාව තුළ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන ආක්‍රමණශීලී ශාක විශේෂයන්ගේ ව්‍යාප්තිය තුරන් කිරීමට කඩිනම් පියවර ගැනීම,— ශ්‍රී ලංකාව තුළ මේ වනවිට ආක්‍රමණශීලී ශාක විශේෂයන් ගණනාවක් ව්‍යාප්ත වෙමින් පවතින අතර යම් යම් සංවිධාන සහ පුද්ගලයන් විසින් දිවයිනේ මංමාවත් දෙපස, සුසාන භූමිවල සහ ක්‍රීඩා පිට්ටනි ආදී පොදු ස්ථානවල රෝපණය කරන ලද ඇකේෂියා වැනි ශාක හේතුකොටගෙන මී මැසි ප්‍රජාවගේ පැවැත්මට මාරාන්තික තර්ජනයක් වී ඇති බව එම ප්‍රදේශවල සිදුකරන ලද පර්යේෂණවලින් සනාථ වී ඇති බැවින්, ශාක මෙන්ම, සත්ත්ව ප්‍රජාවගේද පැවැත්මට ප්‍රබල තර්ජනයක් වී ඇති මෙවැනි ආක්‍රමණශීලී ශාක විශේෂයන්ගේ ව්‍යාප්තිය වළක්වා මුළුමනින්ම තුරන් කිරීමට කඩිනම් පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 59/’19

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා,— වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය නව ක්‍රමයක් හරහා පරිපාලනය කිරීම සඳහා කුඩා වතු හිමිකාරීත්වයන් බවට පත්කොට කම්කරුවන්ට වතු බෙදා දීමට කටයුතු කිරීම,— ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට දීර්ඝ ඉතිහාසයක් පවතින අතර පසුගිය වසර 25ක කාලය තුළ ඔයිල් පාම් ප්‍රමුඛ නව බෝග වගාවන් වැවිලි ක්ෂේත්‍රයට ඇතුළත් වී ඇති අතර පුද්ගලීකරණයට ලක්වී ඇති වැවිලි ක්ෂේත්‍රයේ නොමනා කළමනාකරණය හේතුවෙන් මෙම ක්ෂේත්‍රය පරිහානියට පත්වී කම්කරුවන්හට පවා විශ්වාසයෙන් යුතුව තම රැකියාවන්හි නිරත වීම සඳහා වන ආර්ථික සමාජ පරිසරයක් එහි දක්නට නොමැති බැවින්, අප රටේ ප්‍රධාන අපනයන ආදායම් ක්ෂේත්‍රයක් වන වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රය දැනට සිදුකර ඇති පෞද්ගලීකරණයෙන් ඉවත් කොට රජයේ මැදිහත්වීම යටතේ නව ක්‍රමයක් හරහා පරිපාලනය කිරීම සඳහා කුඩා වතු හිමිකාරීත්වයන් බවට පත්කොට කම්කරුවන්ට වතු බෙදා දී ඒවා තිරසාරව පවත්වාගෙන යාමට රජය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2019 ජූනි 18 වැනි අඟහරුවාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

26/'18

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා පොලිසිය වෙත ලැබී ඇති ස්ත්‍රී දූෂණ, ලිංගික අපයෝජන හා ළමා අපචාර සම්බන්ධ පැමිණිලි සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පැමිණිලි අතරින් මේ වනවිට පරීක්ෂණ අවසන් කළ පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

81/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රැකියා දසලක්ෂයේ රජයේ වැඩසටහන යටතේ මේ වනවිට උත්පාදනය කර ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) උපාධිධාරීන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද රැකියා වැඩසටහන් කවරේද;

(iii) ඒ යටතේ බඳවාගෙන ඇති උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ අතරින් පෞද්ගලික අංශයට යොමු කළ සංඛ්‍යාව කොපමණද;

(v) රජයේ රැකියා අවස්ථාවන් වෙත යොමු කළ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ ස්ථිර සේවයට බඳවා ගත් සංඛ්‍යාව කොපමණද;

(ii) රජයේ අනියම් සේවයට බඳවා ගත් සංඛ්‍යාව කොපමණද;

(iii) රජයට බඳවා ගත් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

(iv) රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා ආදියට අනුයුක්ත කරන ලද සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

144/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වී අලෙවි මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති වී මෝල් හිමියන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වී මෝල් හිමියන්ගේ නම් හා ලිපිනයන්, සුළු හා මධ්‍ය පරිමාණ ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පෞද්ගලික වී මෝල් හිමියන් වෙත වී අලෙවි කිරීමේදී අමාත්‍යාංශය අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

196/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015.01.09 දින සිට 2018.06.30 දින දක්වා අග්‍රාමාත්‍යවරයා විසින් සිදුකළ විදේශ සංචාර;

(ii) එම සංචාරවල අරමුණු;

(iii) එම එක් එක් සංචාරය සඳහා සහභාගි වූ පුද්ගලයන් සංඛ්‍යාව හා ඔවුන්ගේ තනතුරු;

(iv) එම එක් එක් සංචාරය සඳහා වියදම් කළ මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

232/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පාලනය වන විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාලවල හා ඊට අනුබද්ධ පීඨයන් පිළිබඳව ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iii) එම විශ්වවිද්‍යාලයන්හි හා පීඨයන්හි දැනට ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එකී විශ්වවිද්‍යාලයන්හි හා පීඨයන්හි බාහිර උපාධි පාඨමාලා පවත්වා ගෙන යනු ලබන්නේද;

(ii) එක් එක් විශ්වවිද්‍යාලය හා පීඨයෙහි බාහිර උපාධි සඳහා ලියාපදිංචි වී ඇති ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් විශ්වවිද්‍යාල සහ පීඨයන් විසින් බාහිර උපාධි පාඨමාලා සඳහා අය කරනු ලබන ගාස්තු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එක් එක් විශ්වවිද්‍යාල හා පීඨවල බාහිර උපාධි සඳහා ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයන් විසින් පාඨමාලා සඳහා ගෙවනු ලබන මුදල් තැන්පත් කරනු ලබන ගිණුම් කවරේද;

(ii) එම මුදල් බැර කරනු ලබන ගිණුම්වල වර්තමානයේ පවතින ශේෂයන් කවරේද;

(iii) එසේ ගිණුම්ගත කළ මුදල්, මුදල් අමාත්‍යාංශයේ හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හෝ වෙනත් රාජ්‍ය ආයතනයක හෝ අධීක්ෂණයට යටත් වන්නේද;

(iv) එසේ නම්, එම ආයතන කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

262/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම මිළ ගණන් ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම මිළ ගණන් ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

343/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැකිරාව නගරයේ පිහිටි හින්දු කෝවිල ඉතාමත් පැරණි හා අබලන් තත්ත්වයේ පවතින බව දන්නේද;

(ii) දැනට මන්දගාමීව සිදුවන ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් සිදුකර මෙම කෝවිල ආගමික කටයුතු සඳහා හින්දු බැතිමතුන්ට පවරා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

429/'19

ගරු කනක හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "ගම්පෙරළිය" නමින් නව ග්‍රාමීය සංවර්ධන වැඩසටහනක් ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, ඒ යටතේ ක්‍රියාවට නැංවෙන ග්‍රාමීය ව්‍යාපෘතිවල ස්වභාවය කවරේද;

(iii) මේ සඳහා සංවර්ධන යෝජනා ලබා ගනු ලබන ක්‍රමවේදය සහ එම යෝජනා ලබා ගනු ලබන්නේ කවර කමිටුවක් හරහාද යන්න දන්වන්නේද;

(iv) මෙමඟින් එක් වසමකට වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම වැඩසටහනට අදාළ ව්‍යාපෘතිවල කොන්ත්‍රාත් කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන ක්‍රමවේදය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

439/'19

ගරු ජයන්ත සමරවීර මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016.12.31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමතියකින් තොරව අධිකාරියට බඳවාගත් උපදේශකයන් හා මහජන සම්බන්ධතා නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පුද්ගලයන්ගේ, නම හා ලිපිනය, ගෙවනු ලබන දීමනාව, අනුයුක්ත කර ඇති ව්‍යාපෘතිය, බඳවා ගන්නා ලද ක්‍රමවේදය, අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් සහ ලබාදී ඇති ඇති වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වනවිට ඔවුන්ගෙන් කොපමණ සංඛ්‍යාවක් සේවයේ යෙදී සිටින්නේද;

(iv) මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ, නම් ඒ මන්ද?

446/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනාධිපතිවරයා සහ ආරක්ෂක අමාත්‍යාංශයේ, හිටපු ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහි කුමන්ත්‍රණයක් සම්බන්ධයෙන් චෝදනා ලබා සිටින නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතා LTTE සාමාජිකයෙකු, දෙමළ ඩයස්පෝරාව සහ නම් දරා සිටින පාතාල සාමාජිකයෙකු සමඟ සම්බන්ධතා පවත්වා ඇති අයෙකු වන බැවින්, ජනාධිපතිවරයාට සහ ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයාට දැනට ලබාදී ඇති ආරක්ෂාව වැඩි නොකරන්නේ මන්ද;

(ii) ජනාධිපතිවරයා සහ ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා දිවයින පුරා මහජන හමුවීම් ඇතුළු විවිධ කටයුතුවල නිරත වන බැවින්, ඔවුන්ගේ ප්‍රවාහන කටයුතු සඳහා වෙඩි නොවදින රථ හෝ එවැනි පහසුකම් ලබා නොදෙන්නේ මන්ද;

(iii) මේ සම්බන්ධයෙන් කරුණු අනාවරණය කළ නාමල් කුමාර නමැත්තා ප්‍රකාශ කරන පරිදි සිද්ධියට අදාළ තාක්ෂණික සාක්ෂි විනාඩි 05ක් වැනි කෙටි කාලයකින් විනාශ කළ හැකි බැවින්, පරීක්ෂණ සිදුවන විටත් එකී නියෝජ්‍ය පොලිස්පතිවරයා සේවයේ තබා ගැනීමට පොලිස්පතිවරයාට ඇති අවශ්‍යතාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

467/'19

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කය තුළ පිහිටි පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) මෙම එක් එක් පළාත් පාලන ආයතන මඟින් පාලනය වන ළමා උද්‍යාන සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

(v) 2010 වර්ෂයේ සිට මේ දක්වා මෙම එක් එක් ළමා උද්‍යානය සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ලබා දී ඇති වාර්ෂික ප්‍රතිපාදනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) මෙම ළමා උද්‍යාන තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය දැනට ගෙන ඇති පියවර සහ ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

496/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙසෙන ජනතාව උග්‍ර ජල හිඟයෙන් පෙළෙන බව දන්නේද;

(ii) මෙම කොට්ඨාසයේ පිහිටා ඇති රාක්ෂාව, අසු පිනි ඇල්ල යන ජල පෝෂක ප්‍රදේශ තුළින් මා ඔය නිර්මාණය වී ඇති බව දන්නේද;

(iii) ඉහත ජල පෝෂක ප්‍රදේශ හරහා ගලා යන මා ඔය උපයෝගී කරගෙන අරනායක හා මාවනැල්ල වැනි මැතිවරණ කොට්ඨාසවල ජනතාවට ජලය ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) ජලය නොමැතිව පීඩා විඳින ගඟ ඉහල කෝරළේ ජනතාවට පළමුව ජලය ලබා දී අනෙකුත් කොට්ඨාසවලට ජලය ලබා දීම සාධාරණ නොවන්නේද;

(v) ගැටලුවක් ඇති කර නොගනිමින් ගඟ ඉහළ කෝරළේ ජනතාවටත් ජලය ලබාදී අරනායක හා මාවනැල්ල ජනතාවටද ජලය ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

567/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට වී අලෙවි මණ්ඩලය ලැබූ ලාභය/අලාභය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලසීමාව තුළ එක් එක් කන්නයේදී ගොවීන්ගෙන් මිලදී ගත් වී ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය සහ වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කාලසීමාව තුළ වී අලෙවි මණ්ඩලය පාඩු ලබා තිබේ නම්, ඒ සඳහා බලපෑ හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

595/'19

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 286ට අනුව, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය වෙනුවෙන්, "බැඳුම්කර නිශ්කාෂන" ආයතනයක් පිහිටුවනු ලැබුවේද;

(ii) ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අධීක්ෂණය යටතේ අලෙවි ව්‍යුහයක් පිහිටුවීම සඳහා රජයේ ඒකාබද්ධ අරමුදලින් වෙන්කළ රුපියල් මිලියන 500ක් උපයෝජනය කළ ආකාරය පැහැදිලි කරන්නේද;

(iii) වර්ෂ 2015 සිට 2017 දක්වා රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළෙහි විදේශීය ආයෝජකයන්ගේ හැසිරීම කෙබඳු වීද; ඔවුන් විසින් එක් එක් වර්ෂයේදී ආපසු කැඳවූ ආයෝජන වටිනාකම එක්සත් ජනපද ඩොලර්වලින් කොපමණද;

(iv) 2018 වර්ෂයේ සිට විදේශීය ආයෝජකයන්, ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් වෙළෙඳපොළ කෙරෙහි ආකර්ෂණය කර ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

597/'18

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි කලාපවල ඉඩම් ලබාදීම සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය වැනි ප්‍රදේශවලින් අයදුම්පත් කැඳවා තිබේද;

(ii) මහවැලි කලාපවල ඉඩම් ලබාදීම සඳහා ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම අයදුම්පත් අතරින් ඉඩම් ලබාදීම සඳහා සුදුසුසන් තෝරා ගැනීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 ජූනි 19 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

30/'18

ගරු හේෂා විතානගේ මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) 2005 සිට 2017 වර්ෂය දක්වා ධීවර ක්ෂේත්‍රය වෙනුවෙන් වෙන් කරන ලද මුදල වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එසේ වෙන් කරන ලද මුදල් එම එක් එක් වර්ෂ සඳහා ප්‍රමාණවත් වූයේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

86/’18

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ රෝහල්වල සේවය කරන හෙද නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) හෙද නිලධාරි පුරප්පාඩු ඇති රෝහල් කවරේද;

(iii) මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු ඇති වීමට හේතු කවරේද;

(v) රෝහල්වල පවතින හෙද නිලධාරි පුරප්පාඩු හේතුවෙන් රෝගීන් මුහුණ දෙන අපහසුතා අවම කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීමට මේ වනවිට ගැසට් නිවේදන නිකුත් කර තිබේද;

(ii) හෙද නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් කවරේද;

(iii) මේ වනවිට පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර නොමැති නම්, එම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

145/’18

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ නාය යෑමේ අවදානමට ලක්විය හැකි යැයි ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගෙන ඇති ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් කවරේද;

(iii) එම අවදානම් ස්ථානවල ජීවත්වන ජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරීමට අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

210/’18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල, ලබුදූව ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ මේ වනවිට ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිසුන් සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කවර ස්ථානයකද;

(iv) ඒ සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(v) එම නේවාසිකාගාරය ඉදිකර නිමකිරීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

263/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

344/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උපාධිධාරී ගුරු පත්වීම් ලබා දීමේදී උපාධිධාරීන්ගේ විෂයට අදාළ නොවන පත්වීම් ප්‍රදානය කිරීම හේතුවෙන් එම ගුරුවරුන් පාසලේදී තමන්ට ලැබෙන විෂය ඉගැන්වීමේදී අසීරුතාවයන්ට පත්වී ඇති බව දන්නේද;

(ii) මේ වනවිට පත්වීම් ලබාදී ඇති ගුරුවරයන්ගේ විෂයන් මාරු කිරීමට කිසියම් ක්‍රමවේදයක් තිබේද;

(iii) නොඑසේ නම් , ඒ සඳහා ලබා දිය හැකි විසඳුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

430/'19

ගරු කනක හේරත් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය සේවය සතු දුම්රිය ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් සංවර්ධනය කළ යුතු තත්ත්වයේ පවතින දුම්රිය ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා සංවර්ධනය කරන ලද දුම්රිය ස්ථාන සංඛ්‍යාව සහ ඒවයේ නම් කවරේද;

(iv) ඉදිරියේදී සංවර්ධනය කිරීමට නියමිත දුම්රිය ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

540/'19

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ එයාර් වයිස් මාර්ෂල් කේ.ටී.බී.පී. ජයම්පති මහතා 2008.01.08 දාතමින් සහනදායී පදනම යටතේ මෝටර් රථයක් ආනයනය කිරීමට බලපත්‍රයක් ලබාගෙන තම වාහනය රේගුවෙන් නිදහස් කරගෙන ඇති බවත්;

(ii) එම නිලධාරියාට යළිත් සහනදායී පදනම මත මෝටර් රථයක් ලබාගත හැක්කේ වසර 5කට පසුව වුවද, ඉහත කී බලපත්‍රය පිළිබඳ තොරතුරු සාවද්‍ය ලෙස සඳහන් කරමින් 2011.01.14 දින එවකට සිටි ගුවන් හමුදාපතිවරයාගේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශ සහිතව යළිත් සහනදායී පදනම යටතේ මෝටර් රථයක් ආනයනය කිරීමට අයදුම්පතක් ඉදිරිපත් කර, 2011.06.07 දින අදාළ බලපත්‍රය ලබාගෙන මෝටර් රථයක් ආනයනය කර ඇති බවත්;

(iii) ඒ අනුව ඔහු චක්‍රලේඛ නියමයන් උල්ලංඝනය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, මෙම නිලධාරියාට එරෙහිව ගත් නීතිමය පියවර කවරේද;

(ii) චක්‍රලේඛ නියමයන්ට එරෙහිව සහනදායී පදනම යටතේ මෝටර් රථයක් ගෙන්වීමට මෙම නිලධාරියාට නිර්දේශ නිකුත් කිරීම පිළිබඳව එවකට සිටි ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා ගුවන් හමුදාපතිවරයාට එරෙහිව ගනු ලැබූ නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

568/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ නියඟයෙන් පීඩාවට පත් පවුල් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) බවුසර් මඟින් ජලය සපයා දුන් හා නියං ආධාර ලබාදුන් පවුල් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පවතින දැඩි නියඟය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට තවදුරටත් සහන ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

600/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, පිළියන්දල ප්‍රාදේශීය කාර්යාලයේ සේවය කරන මැන් පවර් සේවකයන්ට ගෙවනු ලබන වැටුප කොපමණද;

(ii) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයන්ට ගෙවනු ලබන වැටුප කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මැන් පවර් සේවකයන්ගේ සේවය අවශ්‍ය වී තිබියදී ඔවුන් අඩු වැටුපකට සේවයේ යෙදවීම අයුතු ලෙස ශ්‍රමය ලබා ගැනීමක් නොවන්නේද;

(ii) මෙම මැන් පවර් සේවකයන්ගෙන් අය කර ගනු ලබන සේවක අර්ථසාධක හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් සඳහා ඔවුන්ට ගිණුම් වාර්තා ලබා නොදෙන්නේ මන්ද;

(iii) මෙම සේවකයන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට බඳවා ගැනීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

628/'18

ගරු විමලවීර දිසානායක මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 වර්ෂයේ යල කන්නයේ ජල හිඟය හේතුවෙන් අම්පාර දිස්ත්‍රික්කයේ වී වගා නොකළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එසේ වී වගා කිරීමට නොහැකි වූ ඉඩම් හිමි ගොවි පවුල් සඳහා වන්දි ගෙවන්නේද;

(iii) නොඑසේ නම්, එම ගොවි පවුල් සඳහා සාධාරණ වෙනත් සහනයක් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

630/'18

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 සැප්තැම්බර් 30 දිනට ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එකී එක් එක් තනතුරු පුරප්පාඩුව ඇති වූ දිනය කවරේද;

(iii) එකී තනතුරු පිරවීම සඳහා මේ වනතෙක් පියවර නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

638/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය භාර හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් ජනාධිපතිවරයාට හා ආරක්ෂක අමාත්‍යාංශයේ, හිටපු ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට එරෙහිව සිදු කළේ යැයි කියන කුමන්ත්‍රණය සම්බන්ධයෙන්,

(i) එම නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන් ප්‍රකාශයක් ලබාගෙන තිබේද;

(ii) ඔහුගේ කාර්යාල, නිවාස හා ජංගම දුරකථන ඇමතුම් පිළිබඳ විමර්ශනයක් කර තිබේද;

(iii) දූෂණ විරෝධී බලකායේ මෙහෙයුම් අධ්‍යක්ෂක බව කියන නාමල් කුමාර මහතාට ජීවිත තර්ජන එල්ල වී ඇති බව කියන හෙයින්, ඒ සම්බන්ධ සත්‍ය අසත්‍යතාවය හෙළිකර ගන්නා තෙක්, ඔහුගේ ආරක්ෂාව තහවුරු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉදිරි නීතිමය කටයුතුවලට බාධාවක් නොවන පරිදි මෙම සිද්ධියේ වත්මන් තත්ත්වය කෙසේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ජනාධිපතිවරයාගේ ආරක්ෂාව ඔහුගේ අභිමතය පරිදි තීරණය කළ හැකි වුවත්, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ හා ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ලේකම්, ගෝඨාභය රාජපක්ෂ යන මහත්වරුන්ගේ ආරක්ෂාව වැඩි කිරීමට පියවර ගන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

674/'18

ගරු වන්දිම ගමගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ, අංක 635 ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මහවැව පාලම අබලන් වී ඇති බවත්;

(ii) එම පාලම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ප්‍රතිපාදන ඉල්ලා උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස්වරයා විසින් ඇස්තමේන්තුවක් ඔබ අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත්;

(iii) අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඒ සඳහා ප්‍රතිපාදන මේ දක්වා ලබා දී නොමැති බවත්;

(iv) ඉදිරි වර්ෂා කාලයේදී මහවැව පාලම විනාශ වුවහොත්, ගම්මාන 8 ක ජීවත් වන 7000ක් පමණ වූ ගොවි ජනතාව ප්‍රවාහන දුෂ්කරතාවයකට පත්වී අසරණ වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පාලම ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

945/'19

ගරු මුහම්මදු නසීර් මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ මඩිගේ, උඩතලවින්න, පන්සල පාර, අංක 7/3 දරන ස්ථානයේ පදිංචි එෆ්. සීෆා මෙනෙවිය පූර්ණ ආබාධිත තත්ත්වයේ පසුවන බව දන්නේද;

(ii) වයස අවුරුදු 15ක් වූ ඇයට ආබාධිතයන් සඳහා වූ වෛද්‍යාධාර/මාසික මූල්‍යාධාර ලබා දෙන්නේද;

(iii) ඒ සඳහා විෂය භාර අමාත්‍යාංශය මඟින් අංක MSS/2017/WZ/07 හා 2017.07.04 දිනැති ලිපිය මඟින් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා දැනුවත් කළද, එම මූල්‍යාධාර ලබාදීම ප්‍රමාද කරමින් පවතින බව දන්නේද;

(iv) එසේ නම්, සීඝ්‍රා මෙනෙවියට නොපමාව එම මූල්‍යාධාර ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2019 ජූනි 20 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

38/'18

ගරු හේෂා විතානගේ මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහියංගනය නගරයේ, බුද්ධගයා අනුරුව ආසන්නයේ තාවකාලිකව පවත්වා ගෙන යනු ලබන සතිපොළ වැසි දිනවල ඉතා අපිරිසිදු තත්ත්වයකට පත් වන බව දන්නේද;

(ii) එසේ නම්, මහියංගනය සතිපොළ කඩිනමින් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

87/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වොක්ස්වැගන් කර්මාන්තශාලාව ආරම්භ කිරීම සඳහා මුල්ගල තබන ලද දිනය සහ ස්ථානය කවරේද;

(ii) ඒ සඳහා වෙන් කළ භූමියේ වර්ග ප්‍රමාණය කොපමණද;

(iii) මේ වනවිට එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබේද;

(iv) එසේ නම්, එම ඉදිකිරීම්වල ප්‍රගතිය කවරේද;

(v) ඉදිකිරීම් කටයුතු නිම කර නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කර තිබේද;

(vi) එසේ නම්, මේ වනවිට නිෂ්පාදනය කර ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(vii) නොඑසේ නම්, එයට හේතු සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

146/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පරණගම මැතිවරණ කොට්ඨාසයේ ගම්මාන රාශියක් දිවියන්ගේ තර්ජනයට ලක්වී තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම ගම්මානවල නම් කවරේද;

(iii) එම ගම්මාන දිවියන්ගේ තර්ජනයෙන් මුදා ගැනීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

211/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ, ඒස් ඇඹිලිපිටිය බලාගාරයෙන් විදුලිය මිලදී ගැනීම ආරම්භ කළ දිනය කවරේද;

(ii) එම කාලය තුළ එම බලාගාරයෙන් විදුලි ඒකකයක් මිලදී ගත් මිල කොපමණද;

(iii) එම සමස්ත කාලය තුළ ඒස් ඇඹිලිපිටිය බලාගාරය සඳහා ගෙවූ මුළු මුදල කොපමණද;

(iv) එම බලාගාරය සඳහා හිමිකාර සමාගම ආයෝජනය කර ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වසර 10ක් විදුලි මිලදී ගැනීමෙන් පසු ගිවිසුම දීර්ඝ කළ දිනය කවරේද;

(ii) ගිවිසුම දීර්ඝ කිරීමට හේතු කවරේද;

(iii) ඒ සඳහා මහජන උපයෝගීතා කොමිසම් සභාවේ අනුමතිය ලැබී තිබේද;

(iv) එසේ නම්, එම අනුමතිය සභාගත කරන්නේද;

(v) ඒස් ඇඹිලිපිටිය බලාගාරය සමඟ අත්සන් කළ සියලු ගිවිසුම් සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

264/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

345/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාතේ, පාසල් විශාල සංඛ්‍යාවක ඉස්ලාම් ආගම සහ බුද්ධාගම විෂය ඉගැන්වීම සඳහා ගුරු හිඟයක් ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

431/'19

ගරු කනක හේරත් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රධානතම පොදු ප්‍රවාහන සේවාවක් වන දුම්රිය ප්‍රවාහන සේවය, දුම්රිය නියමිත වේලාවට නියමිත පරිදි ධාවනය නොවීම සහ අධික මඟී තදබදයක් පැවතීම යන ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු ධාවන තත්ත්වයේ පවතින දුම්රිය සංඛ්‍යාව කොපමණද;

(iv) එමඟින් ශ්‍රී ලංකාවේ සියලු දුම්රිය ප්‍රවාහන අවශ්‍යතා ඉටු කළ හැකිද;

(v) 2014 වර්ෂයෙන් පසු දුම්රිය සේවයට නව දුම්රිය බලවේග කට්ටල එක් කර තිබේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ ) නොඑසේ නම්, ඒ මන්ද?

545/'19

ගරු බිමල් රත්නායක මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) අවුරුදු 70ට වැඩි පුරවැසියන්ට ගෙවනු ලබන වැඩිහිටි දීමනාව අයදුම් කළ විශාල පිරිසකට මේ වනතෙක් එම දීමනා ලැබී නොමැති බවත්;

(ii) මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් විමසන විට දැනට දීමනාව ලබන පුද්ගලයන්ගෙන් ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව අනුව ඉතිරි අයට ගෙවීම් කිරීමට කටයුතු කරන බව පවසන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්තමාන විෂය භාර අමාත්‍යවරයා අමාත්‍ය ධුරයට පත්වීමෙන් පසු වැඩිහිටි දීමනාව ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට අයදුම්කර ඇති එහෙත්, මෙතෙක් එම දීමනාව ලැබී නොමැති වැඩිහිටියන්ට එම දීමනාව ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

569/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝගීන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව කොපමණද;

(iii) එම රෝගීන්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම් හා වෙනත් පහසුකම් ලබා දීමට අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

(iv) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඉතා වේගයෙන් පැතිර යන වකුගඩු රෝගය පාලනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

601/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංක 01 ට ශ්‍රේණිගතව තිබූ ස්වාධීන රූපවාහිනී සේවය මේ වනවිට 06 වන ස්ථානයට පත් වී තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2014 සහ 2017 දී ස්වාධීන රූපවාහිනී ආයතනයේ වාර්ෂික ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ස්වාධීන රූපවාහිනී සේවය විකිණීමේ ක්‍රියාදාමයක් සැකසෙමින් පවතින්නේද;

(iii) මෙම ආයතනයේ සේවක වැටුප් ගෙවනු ලබන්නේ ස්ථාවර තැන්පතුවලින්ද;

(iv) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

629/'18

ගරු විමලවීර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි රඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ 2018 යල කන්නයේ වී වගා කළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ජලාශ ව්‍යාපෘතිය යටතේ ඉදිරියේදී වාරි ජල පහසුකම් සැපයීමට හැකියාව ලැබෙන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

631/’18

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 1947 සිට 2000 දක්වා ශ්‍රී ලාංකික පුරවැසිභාවය ලබා දුන් ඉන්දියානු හෝ පාකිස්තානු ජාතිකයන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

756/’19

ගරු රොෂාන් රණසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව, රාජකීය කණිෂ්ඨ විද්‍යාලයේ, 5 ශ්‍රේණිය සමත් ශිෂ්‍යයන් පොළොන්නරුව රාජකීය මධ්‍ය මහා විද්‍යාලයේ, 6 වැනි ශ්‍රේණියට ඇතුළත් කර නොගැනීමට හේතුව කවරේද;

(ii) රාජකීය කණිෂ්ඨ විද්‍යාලයේ, 5 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබූ ශිෂ්‍යයන්ට ඉදිරි පාසල් අධ්‍යාපනය වෙනුවෙන් ලබාදෙන විසඳුම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රාජකීය කණිෂ්ඨ විද්‍යාලයේ 5 ශ්‍රේණිය සමත් ශිෂ්‍යයන් කණිෂ්ඨ විද්‍යාලය තුළම වැඩිදුර අධ්‍යාපනය සඳහා යොමු කරවීමට අදහස්කර තිබේද;

(ii) ඒ සඳහා එම විද්‍යාලයේ අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීමේ කඩිනම් හා දිගුකාලීන සැලසුම් සකස්කර තිබේද;

(iii) එසේ නම්, එම සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

761/’19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ආචාර්ය අයි. එච්. කේ. මහානාම මහතා, ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් තනතුර දැරීමට පෙර අග්‍රාමාත්‍ය අතිරේක ලේකම් තනතුර ද දරා ඇති බවත්;

(ii) එම කාලයේදී ප්‍රධාන ගණන්දීමේ නිලධාරි ලෙස අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලවල තීරණ ගැනීම පමණක් නොව, අමාත්‍ය මණ්ඩලය පත්කළ ටෙන්ඩර් මණ්ඩලවල ද කටයුතු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඖෂධ ආනයනය වැනි කටයුතු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය පත්කළ ටෙන්ඩර් මණ්ඩලවල සභාපති/සාමාජික ලෙස ආචාර්ය මහානාම මහතා කටයුතුකර ඇති දින වකවානු හා දරා ඇති තනතුරු කවරේද;

(ii) එම ටෙන්ඩර් මණ්ඩලවලට ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති ආයතන සහ ඒවායේ සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) ඉදිරිපත්ව තිබූ ටෙන්ඩර්වලින් අනුමතිය ලද ටෙන්ඩර්වලට අදාළ ආයතන හා මිල ගණන් කවරේද;

(iv) ආචාර්ය මහානාම මහතාගේ සභාපතිත්වයෙන් හෝ සහභාගිත්වය සහිත ටෙන්ඩර් මණ්ඩලවල අනුමතිය මත මෙරටට ආනයනය කර ඇති ඖෂධ වර්ග, ප්‍රමාණයන් හා රටවල් කවරේද;

(v) 2010 වර්ෂයේ සිට මේ දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල ටෙන්ඩර් මණ්ඩල රැස්වූ දිනයන් සහ එහි සාමාජිකයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

769/'19

ගරු විදුර වික්‍රමනායක මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස නැගෙනහිර හේවාගම් කෝරළයේ විවිධ සේවා සමුපකාර සමිතියේ, ග්‍රාමීය බැංකු ශාඛාවන්හි තැන්පත් කර ඇති රුපියල් කෝටි 54ක තැන්පත් මුදල් සම්බන්ධයෙන් සිදු වී ඇති අක්‍රමිකතාවයක් හේතුවෙන් සමුපකාර සමිතියට ප්‍රදේශයේ එදිනෙදා ජන ජීවිතයට බලපාන සේවාවන් ඉටුකරවා ගැනීමට ද නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති බවත්;

(ii) තැන්පත් මුදල් ආපසු ලබා ගැනීමට නොහැකි වීමෙන් තැන්පත්කරුවන් සහ සමුපකාර සමිතියේ සාමාජිකයන් ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දී සිටින බවත්;

(iii) මෙම තත්ත්වය හේතුවෙන් විවිධ සේවා සමුපකාර සමිතියේ සේවකයන්ගේ රැකියා පවා අහිමිවීමට ඉඩ ප්‍රස්ථාව පවතින බවත්;

(iv) මෙම වංචාව හේතුවෙන් දිනෙන් දින අදාළ සේවාවන් බිඳ වැටීමෙන් සමුපකාර පද්ධතියම අගාධයට යෑමේ තත්ත්වයකට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම අර්බුදය කඩිනමින් විසඳීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2019 ජූනි 21 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5/'18

ගරු හේෂා විතානගේ මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 2010 - 2015 කාලය තුළ ආරම්භ කරනු ලැබූ උදාගම් නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ව්‍යාපෘතිවල නිවාස ප්‍රතිලාභීන් තෝරා ගැනීමට අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදය කවරේද;

(iii) අදාළ ව්‍යාපෘති හරහා ප්‍රතිලාභීන් ලෙස සහන ලැබූ සංඛ්‍යාව කොපමණද;

(iv) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා රටේ නිවාස නොමැති ජනතාව වෙනුවෙන් ප්‍රමාණවත් සහයෝගයක් ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පැහැර හැර ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

89/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික පරිභෝජනයට අවශ්‍ය ලොකු ලූණු ප්‍රමාණය මෙට්‍රික් ටොන් කොපමණද;

(ii) එම ප්‍රමාණයෙන් දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන ප්‍රමාණය කොපමණද;

(iii) දේශීය වශයෙන් ලොකු ලූණු වගා කරනු ලබන ප්‍රදේශ කවරේද;

(iv) ලොකු ලූණු වගා කරන ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(v) ලොකු ලූණු වගා බිම් ප්‍රමාණය කොපමණද;

(vi) 2015 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික ලොකු ලූණු අස්වනු ප්‍රමාණය එක් එක් වර්ෂයට අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලොකු ලූණු ගොවීන් ශක්තිමත් කිරීම සඳහා ලබා දී ඇති සහන කවරේද;

(ii) ලොකු ලූණු වගාව ශක්තිමත් කිරීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

138/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, වැවිලි සමාගම් ආශ්‍රිතව සේවය කරන සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල මන්ද පෝෂණය ඉහළ මට්ටමක පවතින බව දන්නේද;

(ii) යහපාලන රජය විසින් ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම සඳහා ලබාදෙන "පෝෂණ මල්ල" වැඩසටහනට සමගාමීව, වතු වැවිලි සමාගම් හරහාද එම ජනතාවට පෝෂණ මල්ලක් ලබාදීම සුදුසු බව පිළිගන්නේද;

(iii) එසේ නම්, වතු වැවිලි සමාගම් හරහා එවැනි වැඩසටහනක් දියත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

207/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පානදුර, වෑකඩ, ජන උදානගම නිවාසලාභීන් 35 දෙනෙක් 1993 වසරේ සිට එම ස්ථානයේ පදිංචිව සිටින බවත්;

(ii) 2006 වසරේදී එවකට පානදුර නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා විසින් එම නිවාසලාභීන්ට නිත්‍යානුකූල ඔප්පු ලබාදිය යුතු බවට පානදුර නගර සභාවට ඉදිරිපත් කළ යෝජනාව ඒකමතිකව සම්මත වූ බවත්;

(iii) 2014 වසරේදී පානදුර නගර සභාව විසින් මැනුම් නියෝගයක් ලබාගෙන එම ඉඩම් මැන ඔප්පු ප්‍රදානය කිරීමට සූදානම් කර තිබූ බවත්;

(iv) 2018 වසරේ මැයි මාසයේදී වර්තමාන පානදුර නගර සභාව යළිත් එම යෝජනාව ඒකමතිකව සම්මත කරගත් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වැකඩ, ජන උදානගම නිවාසලාභීන්ට මෙතෙක් නිත්‍යානුකූල ඔප්පු ලැබී නොමැති බව පිළිගන්නේද;

(ii) එම නිවාසලාභීන්ට ඔප්පු ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

265/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

346/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මහවැලි H කලාපයේ පිහිටි ගල්නෑව බස්නැවතුම්පොළ ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බව දන්නේද;

(ii) එය මගී ජනතාවට භාවිතයට ගත හැකි වන අයුරින් අලුත්වැඩියා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

409/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සහ 2016 තුළදී,

(i) ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජනවලින් උපයාගෙන රටෙන් බැහැර කරගෙන ගොස් ඇති ලාභ ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ මුදල් බැහැර කරගෙන යෑම හේතුවෙන් රුපියලේ අගය කොපමණ බලපෑමකට ලක් වූයේද;

(iii) එක් එක් ආයෝජනය මඟින් ශ්‍රී ලංකාවට රැකියා අවස්ථා මඟින් ලැබුණු ප්‍රතිලාභය සහ වෙනත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

453/'19

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ කාර්යභාරයන් කවරේද;

(ii) 2017 වර්ෂයේදී මහජන සුබසාධනය උදෙසා සිදුකළ වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන් වෙනුවෙන් වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ, වැඩිහිටි ජනගහනය සීඝ්‍ර ලෙස ඉහළ යන බවත්;

(ii) වැඩිහිටි ජනගහනයෙන් බොහෝ දෙනෙකුට ජීවත් වීමට කිසිදු ආදායමක් නොමැති බවත්;

(iii) ආදායම් උපයාගත හැකි ආකාරය පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවන බවත්;

(iv) දරුවන් ඔවුන්ව රැකබලා ගැනීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් අසරණ වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, ඒ සඳහා ගනු ලබන විසඳුම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

516/'19

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) 2014.12.31 දිනට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවයේ නියුක්ත ස්ථිර, අනියම්, විශේෂ ව්‍යාපෘති හා පුහුණුවන කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2017.09.30 දිනට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවයේ නියුක්ත ස්ථිර, අනියම්, විශේෂ ව්‍යාපෘති හා පුහුණුවන කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2017.09.30 දිනට ඉහත එක් එක් කාර්ය මණ්ඩලයේ සේවයේ නියුක්ත පුද්ගලයන්ගේ නම, ලිපිනය, පදිංචි ග්‍රාම නිලධාරි වසම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහන් ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

541/'19

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දැනට වසර කිහිපයකට පෙර පොලිස් නිලධාරින්ට රු.150,000/-ක සහන මිලකට යතුරුපැදි ලබා දුන් බවත්;

(ii) එම යතුරුපැදි ලබා දීමේදී කිසිදු කොන්දේසියකට යටත් නොකළ බවත්;

(iii) එසේ වුවද, යතුරුපැදි ලබා ගත් විශ්‍රාමික පොලිස් නිලධාරින් සියලු දෙනාටම පාහේ රු.150,000 - 200,000 අතර මුදලක් ගෙවන ලෙස බල කර ඇති බවත්;

(iv) එම මුදල ගෙවන තෙක් විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ නොකරන බව ඔවුන්ගේ සේවා ස්ථානවලින් දන්වා ඇති බවත්;

(v) මේ අනුව විශ්‍රාමික පොලිස් නිලධාරින් විශාල පිරිසක් දීර්ඝ කාලයක සිට විශ්‍රාම වැටුප් නොලැබීම හේතුවෙන් අසරණවී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පිරිසට විශ්‍රාම වැටුප් ගෙවීම පිණිස නොපමාව සුදුසු ක්‍රමවේදයක් සකසන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

570/'19

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා, ශ්‍රී ලංකාවට කිරිපිටි ආනයනය කිරීම සඳහා වැය වූ මුදල, එක් එක් වර්ෂය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාවට කිරිපිටි ආනයනය කරනු ලබන සමාගම්වල නම් සහ ඔවුන්ගේ නිෂ්පාදනවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

633/'18

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1948 සිට 2015 දක්වා විවිධ ගිවිසුම් සහ නීති යටතේ ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාවේ පදිංචියට ගිය හෝ යැවූ පුද්ගලයන් සංඛ්‍යාව;

(ii) වර්ෂ 1983 සිට 2009 දක්වා සරණාගතයන් ලෙස ඉන්දියාවට ගිය පුද්ගලයන් සංඛ්‍යාව;

(iii) වර්ෂ 2009 සිට 2017 දක්වා සරණාගතයන් ලෙස ඉන්දියාවට ගිය පුද්ගලයන්ගෙන් නැවත ශ්‍රී ලංකාවට පැමිණි පුද්ගලයන් සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

681/'18

ගරු කනක හේරත් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම සතු ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ගුවන් යානය භාවිතා කර ඇති කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කල්බදු ගිවිසුම් අවසන් වීමෙන් පසු අදාළ සමාගම් වෙත නැවත ලබා දුන් ගුවන් යානා භාවිතා කර ඇති කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙලෙස නැවත ලබා දුන් ගුවන් යානාවලට වඩා පැරණි ගුවන් යානා සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම සතුව කල්බදු ක්‍රමය යටතේ තවමත් භාවිතා කරනු ලබන්නේද;

(iii) එසේ නම්, මෙතරම් පැරණි ගුවන් යානා මෙතෙක් රඳවා ගැනීමට ඇති අවශ්‍යතාවය කවරේද;

(iv) ඒ සඳහා වන නිර්ණායක කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

762/’19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මේ වනවිට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන නිවාස ආධාර, නිවාස ණය හා උපකරණ ලබා දීම සහ නිවාස ඉදිකර දීම ආදි වැඩසටහන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) “ග්‍රාම ශක්ති” නමැති රුපියල් ලක්ෂ 5ක නිවාස ආධාර වැඩසටහන, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(ii) එම වැඩසටහන යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට වෙන් කර ඇති මුදල කොපමණද;

(iii) ඒ සඳහා ප්‍රතිලාභීන් තෝරාගන්නා ක්‍රමවේදය සහ ඒ සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා කවරේද;

(iv) එම වැඩසටහන යටතේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව තෝරාගෙන ඇති පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) ඒ සඳහා යම් යම් දේශපාලන පක්ෂවල සංවිධායකවරයන්ගේ ලිපි අනුව ප්‍රතිලාභීන් තෝරා ගන්නා බවට පැමිණිලි ලැබෙන බැවින් ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

770/’19

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් සභා අතරින් නිල කාලය අවසන් වීම හේතුවෙන් මේ වනවිට විසුරුවා හැර ඇති පළාත් සභා සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ පළාත් සභා විසුරුවා හැරීමෙන් පසුව මේ වනවිට ගතවී ඇති කාලය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(iii) විසුරුවා ඇති පළාත් සභාවලට අමතරව, ඉතිරිව ඇති පළාත් සභාවල නිල කාලය අවසන් වීමට ඇති කාලය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(iv) විසුරුවා හැර ඇති පළාත් සභාවල මැතිවරණ පවත්වා එම පළාත් සභා සක්‍රිය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?